

අධ්‍යාපන අමාත්‍යාංශය
නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය
கல்வி அமைச்சு
திறன் மேம்பாடு, தொழிற்கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்கத் துறை
Ministry of Education
Skills Development, Vocational Education, Research and Innovation Division

2023

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල

திறன் மேம்பாட்டு நிதி லிமிடெட்

Skills Development Fund Limited

SDFL
Creating Career Confidence ...

නිපුණතා සංවර්ධන අරමුදලේ සභාපතිතුමියගේ පණිවිඩය.....

1990 දශකයේ දී නැගෙනහිර ආසියාවේ සංවර්ධනය වන රාජ්‍යයන් ශ්‍රම බලකායේ ඵලදායීත්වය හා කාර්යක්ෂමතාව හසුරුවන ප්‍රධාන යාන්ත්‍රණය ලෙස රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශය ඒකාබද්ධව "නිපුණතා සංවර්ධන අරමුදල" නමින් අරමුදල් ස්ථාපිත කිරීමේ සංකල්පය ක්‍රියාත්මක කල අතර, මෙම සංකල්පය තුළින් එම රාජ්‍යයන්හි ජාතික ශ්‍රම බලකාය පුහුණු කිරීම් සාර්ථකව ක්‍රියාවට නංවා තිබේ. ඒ අනුව මෙම සංකල්පයේ වටිනාකම පසක් කරගනිමින් නැගෙනහිර ආසියානු ආදර්ශය පදනම් කරගෙන දකුණු ආසියාවේ "නිපුණතා සංවර්ධන අරමුදල" නමින් ආයතනයක් ස්ථාපිත කල ප්‍රථම රාජ්‍ය ලෙස ශ්‍රී ලංකාව 1999 අගෝස්තු මස 20 වන දින 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස මෙම ආයතනය ලියාපදිංචි කරන ලදි.

දැනට අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ස්වයං ආදායම් උත්පාදන ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වන සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ රන් කොටස්කරු (Golden Shareholder) සහ 98%ක කොටස් හිමිකරු වන්නේ ශ්‍රී ලංකා මහාභාණ්ඩාගාරය යි.

රාජ්‍ය සහ පෞද්ගලික ව්‍යවසායක ආයතනයන්හි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, මධ්‍යම කළමනාකාරීත්වය, අධීක්ෂණය සහ ඉන් පහළ ශ්‍රේණි ආවරණය වන පුහුණු වැඩසටහන් සහ පාඨමාලා හඳුන්වා දීමට මෙන්ම සංවිධානය කිරීමටත් සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල සමත්ව ඇත. ඒ සඳහා නිපුණ වූත්, කැපවූත් කාර්ය මණ්ඩලයක් අප සතුව ඇත.

නව සියවසේ ගොඩ නැඟෙන දැනුම් ආර්ථිකයට (Knowledge Economic) සාර්ථකව අනුගත වියහැකි නූතන විද්‍යාත්මක කළමනාකරණ ඥාණයෙන් පෝෂිත නිපුන ශ්‍රමබලකායක් ජාතික ආර්ථිකයට උරුම කර දීම නිපුණතා සංවර්ධන අරමුදලේ පරම අභිප්‍රාය වන්නේ ය.

නීතීඥ මේරි ටී. ඩික්මන්
සභාපතිනි
සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල

පටුන

1. සමාගමේ පසුබිම	01
2. දැක්ම, මෙහෙවර සහ අරමුණු	02
3. ආයතනය ස්ථාපිත කිරීම	03
4. ආයතනික ව්‍යුහය	04 - 05
5. අධ්‍යක්ෂ මණ්ඩලය - 2023	06 - 11
6. විගණන හා කළමනාකරණ කමිටුව – 2023	12
7. අවදානම් කළමනාකරණ උපාය මාර්ග	13
8. සමාජ වගකීම් (CSR) පිළිබඳ ආයතනයේ වගකීම	14
9. කාර්යසාධන සමාලෝචනය	15 - 22
10. වාර්ෂික ගිණුම් වාර්තාව	23 - 50
11. විගණන වාර්තාව	51 - 55

සමාගමේ පසුබිම

ආයතනයේ නම	සී/ස නිපුණතා සංවර්ධන අරමුදල
තත්ත්වය	පූර්ණ රජය සතු සමාගමකි
අමාත්‍යාංශය	අධ්‍යාපන අමාත්‍යාංශය
තැපැල් ලිපිනය	354 / 2 7 වන මහල "නිපුණතා පියස," ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.
වෙබ් ලිපිනය	www.skillsdevelop.lk
විද්‍යුත් තැපැල් ලිපිනය	skillsdevelopgov@gmail.com
දුරකථනය	011-2507274
ෆැක්ස්	011-2055601
බැංකුකරුවන්	ලංකා බැංකුව මහජන බැංකුව
විගණකවරුන්	ජාතික විගණන කාර්යාලය

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

තේමාව

මානව සංවර්ධනය තුළින් අතිවිශිෂ්ඨත්වය සහ සාර්ථකත්වය

දැක්ම

නිපුණතා සංවර්ධනයෙහි ජාතික නායකත්වය

මෙහෙවර

නිපුණතා සංවර්ධනය තුළින් ව්‍යවසාය තරඟකාරීත්වය උද්දීපනය කිරීම



SDFL
Creating Career Confidence ...

ආයතනය ස්ථාපනය කිරීම

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල යනු කාර්මික අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකායේ නිර්දේශය මත 1998 දී නියමු ව්‍යාපෘතියක් ලෙස පිහිටුවන ලද්දකි. මෙම කාලය තුළ ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල එයට අනුග්‍රහය දැක්වීය.

1999 අගෝස්තු 20 වන දින, සීමාසහිත වගකීම් සමාගමක් ලෙස, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සී/ස නිපුණතා සංවර්ධන අරමුදල සංස්ථාගත කරන ලදී. ලි.ප. අංකය: N(PBS)832.

1999 වසරේ සැප්තැම්බර් මාසයේදී සමාගමේ කොටස් මිළදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය රු. දසලක්ෂ 100 ක මුදලක් අනුමත කළ අතර, අරමුදල විසින් එය සුරක්ෂිත ලෙස ආයෝජනය කරන ලදී. මෙම සුරක්ෂිත ආයෝජනයෙන් ලැබෙන ආදායමත්, සමාගමේ මෙහෙයුම් මඟින් ලැබෙන ආදායමත් අරමුදලේ පුනරාවර්ථන වියදම් සඳහා ප්‍රමාණවත් බවට යෝජනා කරන ලදී. නිපුණතා සංවර්ධන අරමුදල ස්වයං ආදායම් උත්පාදන ආයතනයක් වශයෙන්ද, රජයේ මුල් ආයෝජනය, ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය සහ වෙනත් ආයෝජකයන් ආරක්ෂිත බවද මෙම සැකසුම් වලින් තහවුරු වේ.

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස නැවත ලියාපදිංචි කරන ලද අතර, ලියාපදිංචි අංකය PB 833 වේ.


ප්‍රධාන අරමුණු

සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ සමාගම් පනතේ සකස් කර ඇති පරිදි ප්‍රධාන අරමුණු වනුයේ :

- රැකියා ප්‍රවිෂ්ඨ පුහුණුව, නිපුණතා සංවර්ධනය සහ සේවක ප්‍රතිපුහුණුව.
- පුහුණුව, නිපුණතාවය සහ අභිප්‍රේරණය සහිත ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම සඳහා ව්‍යවසාය පදනම් කරගත් පුහුණු කිරීම් පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීම.
- පුහුණු ආයතන සහ සේවා පක්ෂය අතර සම්බන්ධතා සම්පාදනය කිරීම.

SDFL
Creating Career Confidence ...

ආයතන ව්‍යුහය





SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ සේවක සංඛ්‍යාව

2023.12.31 දිනට කාර්ය මණ්ඩලය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව
1. සාමාන්‍යාධිකාරී	01	-
2. වැඩසටහන් උපදේශක (කොන්ත්‍රාත්)	02	01
3. ගණකාධිකාරී	01	01
4. පරිපාලන නිලධාරී	01	01
5. වැඩසටහන් නිලධාරී	02	01
6. පුහුණු උපදේශක	02	01
7. කළමනාකරණ සහකාර	18	16
8. රියදුරු	02	02
9. කාර්යාල කාර්ය සහායක	03	04
මුළු එකතුව	**32**	**27**



SDFL
Creating Career Confidence ...

අධ්‍යක්ෂක මණ්ඩලය – 2023

නිපුණතා සංවර්ධන අරමුදල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් 12 දෙනෙකුගෙන් සමන්විත වන අතර, මහා භාණ්ඩාගාර ලේකම් විසින් මෙම සාමාජිකයන් පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ලේඛණය පහත දක්වා ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලය 2023.01.01 සිට 2023.03.10 දක්වා

1. නීතිඥ මේරි ටී. ඩික්මන් මහත්මිය (සභාපති)
2. ඩී.පී.ජී. ප්‍රදීප් මහතා (භාණ්ඩාගාර නියෝජිත)
3. ආර්.එම්.ඩී.එම්. කුමාරි මහත්මිය (අමාත්‍යාංශ නියෝජිත)
4. කුසල් ද සිල්වා මහතා
5. නීතිඥ මධුරංග විජයරත්න මහතා
6. චතුර ද සිල්වා මහතා
7. ඩී.ආර්. සෝමවර්ධන මහතා

අධ්‍යක්ෂක මණ්ඩලය 2023.03.11 සිට 2023.12.31 දක්වා

1. නීතිඥ මේරි ටී. ඩික්මන් මහත්මිය (සභාපති)
2. ඩී.පී.ජී. ප්‍රදීප් මහතා (භාණ්ඩාගාර නියෝජිත)
3. ආර්.එම්.ඩී.එම්. කුමාරි මහත්මිය (අමාත්‍යාංශ නියෝජිත)
4. කුසල් ද සිල්වා මහතා
5. නීතිඥ මධුරංග විජයරත්න මහතා
6. චතුර ද සිල්වා මහතා
7. ඩී.ආර්. සෝමවර්ධන මහතා
8. ඒ.අයි. හේවාපතිරණ මහත්මිය

SDFL
Creating Career Confidence ...

මේරි ටී. ඩික්මන් මහත්මිය

(නීතීඥ)

සභාපති

මේරි තෙරේසා ඩික්මන් මහත්මිය මාතර, ශාන්ත මරියා කන්‍යාරාමයෙන් පාසැල් අධ්‍යාපනය ද කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීති පාඨයෙන් නීතිය ද හදාරා තිබේ. 1996 වසරේ දී ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස ඇතුළත් වී ලියාපදිංචි වී ඇති අතර, ඩික්මන් මහත්මිය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් මෙන්ම සමාගම් ලේකම් සහ ප්‍රසිද්ධ නොතාරිස්වරියක ලෙසද කටයුතු කරයි. ජාතික කම්කරු සම්මේලනය සඳහා "දරු සෙත වැඩසටහනේ" ආරම්භක සාමාජිකයාවූ අතර 1996 සිට 1998 දක්වා වැඩසටහන් නිලධාරියෙකු ලෙස සේවය කර තිබේ. 2014 - 2015 දක්වා දැව සහයෝගිතාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද, 2016-2018 දක්වා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයාගේ නීති උපදේශක ලෙස ද කටයුතු කර තිබෙන ඩික්මන් මහත්මිය කනිෂ්ඨ නීතිඥවරුන්ගෙන් සමන්විත නීතිඥ මණ්ඩලයක් ද පවත්වා ගෙන යනු ලබයි. තවද, ඩික්මන් මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, සිවිල් අභියාචනා මහාධිකරණය, වාණිජ මහාධිකරණය, දිස්ත්‍රික් අධිකරණය, මහේස්ත්‍රාත් අධිකරණ, කම්කරු විනිශ්චය සභා සහ කම්කරු බේරුම්කරණ අධිකරණ ඉදිරියේ අපරාධ, සිවිල්, ආයතනික, වාණිජ සහ පරිපාලන නීතිය යන ක්ෂේත්‍රවල ක්‍රියාකාරීව සම්බන්ධ වී තිබේ. ඊට අමතරව මූලික අයිතිවාසිකම් අයදුම්පත් මෙන්ම මැතිවරණ පෙත්සම්, නෙරපා හැරීමේ කරුණු ආදියට අදාළ කටයුතුවල ද පෙනී සිටින ඩික්මන් මහත්මිය, වාණිජ කටයුතු බැංකු, මූල්‍ය අංශය, බුද්ධිමය දේපළ රක්ෂණය, සමාගම් පනතට අනුව නඩු පැවරීම යන ක්ෂේත්‍රවල වන අතර සිවිල් කටයුතු ටෙස්ටමෙන්ටරි, ඉඩම්, කොටස් කිරීම සහ කුලී සහ නෙරපා හැරීමේ කටයුතුවලට අදාළ නීති කටයුතු සම්බන්ධයෙන් පෙනී සිටියි. එසේම LB Finance, Valibal Finance, Delmage forsyth & Co. Ltd, සහ Institution of Fashion Technology ඇතුළු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සමාගම් හි නීති උපදේශක ලෙස ද කටයුතු කරයි. 2023 ජනවාරි සිට කැලණිය විශ්ව විද්‍යාලයේ කවුන්සිලයේ සාමාජිකයෙකු, විගණන කමිටුවේ සාමාජිකයෙකු සහ කැලණිය විශ්ව විද්‍යාලයේ අධ්‍යයන නොවන කාර්ය මණ්ඩලය තෝරා ගැනීම ද ඩික්මන් මහත්මිය කටයුතු කරයි. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේත් කොළඹ නීති සංගමයේත්, කොළඹ නීති පුස්තකාලයේත් යාවජීව සාමාජිකාවක ලෙස කටයුතු කරන මේරි ටී. ඩික්මන් මහත්මිය 1996 දී නෙදර්ලන්තයේ ජාත්‍යන්තර තරුණ වැඩසටහනේ ශ්‍රී ලංකාව නියෝජනය කර තිබේ.

SDFL
Creating Career Confidence ...

ඩී. පී. ජී. ප්‍රදීප් දිසානායක මහතා

අධ්‍යක්ෂ (මූල්‍ය), තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව,

මුදල් අමාත්‍යාංශය.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - භාණ්ඩාගාර නියෝජිත

ඩී.පී.ජී. ප්‍රදීප් දිසානායක මහතා, කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජ උපාධිය ද, කැළණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ද ලබා ගෙන තිබෙන අතර, Miloda Academy of Financial Studies හි රාජ්‍ය මිලදී ගැනීම් සහ ගිවිසුම් කළමනාකරණ ඩිප්ලෝමාව සම්පූර්ණ කර Australian Computer Society (ACS) සාමාජිකත්වය ලබා ගෙන ඇත. 1993 වසරේ දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාරවරයෙකු වශයෙන් වෘත්තීය ජීවිතය ආරම්භ කර ඇති අතර වසර 20ක පමණ කාලයක් ගණකාධිකරණ සේවයේ නිලධාරියෙකු ලෙස සේවය කර ඇත. 2023 වසර වනවිට ඒ මහතා මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මූල්‍ය) ලෙස සේවයේ නිරත වී තිබේ. ඒ මහතාගේ සේවා කාලය තුල මුදල් අමාත්‍යාංශයට අමතරව දුම්රිය දෙපාර්තමේන්තුව, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කම්කරු විනිශ්චය ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ජාතික ඒකාබද්ධතා හා නිල භාෂා අමාත්‍යාංශය යන ආයතන වල සේවයේ නියුතුව තිබේ.

ආර්. එම්. ඩී. එම්. කුමාරි මහත්මිය

ප්‍රධාන ගණකාධිකාරී - අධ්‍යාපන අමාත්‍යාංශය,

නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - අමාත්‍යාංශ නියෝජිත

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන විශේෂ උපාධිය දෙවන පෙළ සාමාර්ථයක් සහිතව ලබා ඇති අතර රාජ්‍ය කළමනාකරණය (Master of Public Management) පිළිබඳ පශ්චාත් උපාධිය ද රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ද (Higher National Diploma in Public Procurement and Contract Administration (HN-DIPPCA) සම්පූර්ණ කර ඇත. තවද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CASL) සහතිකලත් ව්‍යාපාර ගණකාධිකාරී සාමාජිකත්වය ද (CBA) උසුලයි. තවද, Association of Public Finance Accountants of Sri Lanka (APFASL) ආයතනයේ ද සාමාජිකත්වය උසුලයි. 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ ගිණුම් සහකාර තනතුරකට පත්ව අධිකරණ අමාත්‍යාංශයෙන් රාජ්‍ය සේවය ආරම්භ කර ඇති අතර, 2008 වසරේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට (SLAcS) පත්ව ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරීවරියක ලෙස තරුණ කටයුතු අමාත්‍යාංශය, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වැනි රාජ්‍ය අංශයේ ප්‍රධාන අමාත්‍යාංශ කිහිපයක වසර 20ක පමණ රාජ්‍ය මූල්‍යකරණය, ගිණුම්කරණය, අභ්‍යන්තර විගණනය, රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය හා රාජ්‍ය පරිපාලනය පිළිබඳ විවිධ වගකීම් දරන ලද නිලධාරිනියකි. වර්ථමානයේ දී කුමාරි මහත්මිය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිපුණතා සංවර්ධන හා වාත්තීය අධ්‍යාපන අංශයේ ප්‍රධාන ගණකාධිකාරී තනතුරේ සේවය කරයි.

SDFL
Creating Career Confidence ...

කුසල් ද සිල්වා මහතා
(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

කුසල් ද සිල්වා මහතා සම්පත් බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරී (ආයතනික මූල්‍ය) ලෙස කටයුතු කරයි. ඒ මහතා ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධිය ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති (MBA) උපාධිය ද ලබා ගෙන තිබෙන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් SFIB සහ ADCM ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයෙන් භාණ්ඩාගාර සහ විදේශ විනිමය මෙහෙයුම් පිළිබඳ සහතිකය ද, කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනයෙන් FCMA ඇතුළු සුදුසුකම් සපුරාලමින් වසර 26ක පමණ කාලයක් විධායක ශ්‍රේණියේ සේවා පළපුරුද්ද ලබා ගෙන තිබේ. මෙම සම්පත් බැංකු කේෂ්ත්‍රයට අදාලව කුසල් මහතා ජා-ඇල හා වත්තල ශාඛාහි ශාඛා කළමනාකරු, කළමනාකරු (ප්‍රේෂණ), ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ප්‍රේෂණ), ප්‍රධාන කළමනාකරු (ප්‍රේෂණ), ප්‍රේෂණ ප්‍රධානී, කාඩ්පත් / ප්‍රේෂණ සහ බැංකු නෝට්ටු මෙහෙයුම් අංශ ප්‍රධානී, සහකාර සාමාන්‍යාධිකාරී (මෙහෙයුම් හා කාඩ්පත් මධ්‍යස්ථානය), සහකාර සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර බැංකුකරණය) වශයෙන් ද තනතුරු දරමින් සම්පත් බැංකුවේ වසර 26ක පමණ සේවා පළපුරුද්දක් ලබා තිබේ.

ඩී. එම්. එම්. එම්. විජයරත්න මහතා
(නීතීඥ)
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ඩී. එම්. එම්. එම්. විජයරත්න මහතා (LLB ගෞරව - කොළඹ විශ්වවිද්‍යාලය) දැනට ශ්‍රී ලංකා අධිකරණ උසාවියේ නීතීඥවරයෙකු ලෙස සේවය කරමින් සිටින අතර නෝටරි පබ්ලික්, සමාගම් ලේකම්, දිවුරුම් ගන්නා කොමිෂන්කරු ලෙසද කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ මණ්ඩල සාමාජිකයෙකු වන අතර මොරටුව නීතීඥ සංගමයේ හිටපු ලේකම්වරයෙකුද වේ.

ශ්‍රී ලංකා තරුණ නීතීඥ සංගමයේ (Young Lawyers Association) සභාපතිවරයා ලෙස ඔහු වෘත්තීය හා සමාජ ක්‍රියාකාරී ලෙස විශාල සිවිල් හා දේශපාලන කටයුතු වල නිරත වන අතර දැනට යුක්තිය සඳහා නීතීඥ සංගමය (Lawyers for Justice Association) හි උප සභාපති තනතුරද දරයි.

SDFL
Creating Career Confidence ...

චතුර ද සිල්වා මහතා

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

කොළඹ 03, මහානාම විද්‍යාලයෙන් පාසැල් අධ්‍යාපනය අවසන් කර ඔස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලයෙන් (Deakin University) වාණිජවේදී උපාධිය සහ ශාස්ත්‍රපති විද්‍යාවේදී උපාධිය ලබා ගෙන තිබේ. ජාතික ලොතරැයි මණ්ඩලයේ 'ඩිජිටල්කරණය දෙසට' ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශක ලෙසත්, ඩුබායි හි IPG සමූහයේ දේශීය ප්‍රධානී ලෙසත්, නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් අංශයේ ඩිජිටල්කරණ ප්‍රධාන උපදේශක ලෙසත්, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ඩිජිටල්කරණය සඳහා පර්යේෂණ ප්‍රධානී ලෙසත්, එඩිසන් ඉන්කෝපරේෂන් (ජේටන්ට් බලපත්‍රලාභී බලශක්ති සමාගම) හි නිර්මාතෘ සහ ප්‍රධාන විධායක නිලධාරී ලෙසත්, ජර්මනියේ පුනර්ජනනීය බලශක්තිය සමඟ හවුල් වෙමින් ශ්‍රී ලංකාවේ බලශක්ති සහ කෘෂිකාර්මික අංශය සම්බන්ධ කිරීමෙන් තිරසාර සංවර්ධනය පිළිබඳ “Vworldwide Sri Lanka” හි පර්යේෂණ සහ සංවර්ධන ප්‍රධානී ලෙසත්, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ස්ථාන හඳුනාගැනීමේ සහ කළමනාකරණ පද්ධතියේ ව්‍යාපෘති ප්‍රධානී ලෙසත්, ඊට්ස් ශ්‍රී ලංකා (On-demand delivery platform) හි නිර්මාතෘ ලෙසත්, Shifts සමාගම් සමූහයේ උපදේශක ලෙසත් චතුර ද සිල්වා මහතා කටයුතු කර ඇත.

දනුෂ රුවන්තික සෝමවර්ධන මහතා

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

දනුෂ රුවන්තික සෝමවර්ධන මහතා අම්බලන්ගොඩ, ධර්මාශෝක විද්‍යාලයෙන් පාසැල් අධ්‍යාපනය අවසන් කර තිබේ. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ, තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලාව ද, වේල්ස් විශ්ව විද්‍යාලය විසින් පිරිනමන ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද සෝමවර්ධන මහතා විසින් ලබා ගෙන ඇත. එතුමා ජාත්‍යන්තර ව්‍යාපාර හා තාක්ෂණ විද්‍යාලයේ සේවයේ නියුතුව සිටින අතර, නිපුණතා සංවර්ධන අරමුදලට අමතරව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. එපමණක් නොව සෝමවර්ධන මහතා සන්ඩර්ලන්ඩ් (Sunderland) විශ්වවිද්‍යාලයෙත්, කාඩිෆ් මෙට්රොපොලිටන් (Cardiff Metropolitan) විශ්වවිද්‍යාලයෙත් දේශකවරයෙකු වශයෙන් ද කටයුතු කරයි.

SDFL
Creating Career Confidence ...

අයෝමි ඉරෝෂිකා හේවාපතිරණ මෙනවිය.

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

අයෝමි ඉරෝෂිකා හේවාපතිරණ මෙනවිය කෑගල්ල ජෝෂප් කන්‍යාරාමයෙන් පාසැල් අධ්‍යාපනය ආරම්භ කරමින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගය විද්‍යා විෂයයන්ගෙන් හදාරා තිබේ. 2003 වසරේ දී හේවාපතිරණ මෙනවිය Cosmic Technologies සමාගමේ පුහුණු කළමනාකරුවෙකු ලෙස සම්බන්ධ වී 2004 වසරේ දී විදේශ වෙළඳ කළමනාකරු ලෙස පත්වීම් ලබා තිබේ. එතුමිය 2012 වසරේ දී එම සමාගමේ සාමාන්‍යාධිකාරී තනතුරටත්, ඉන් අනතුරුව 2018 වසරේ දී අධ්‍යක්ෂ (වාණිජ) තනතුරට උසස් වී ඇත. 2012 වසරේ දී Cosmic Technologies සමාගමේ ISO 9001:2015 තත්ත්ව පද්ධතිය ස්ථාපිත කිරීමට ඇය සක්‍රීයව දායකත්වය ලබාදී තිබේ. අයෝමි ඉරෝෂිකා හේවාපතිරණ මෙනවිය ඊට අමතරව Amber Holdings පුද්ගලික සමාගමේ සභාපතිනිය ලෙස ද කටයුතු කරයි.

2023 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 ක් පහත දිනවලදී නාරාහේන්පිට සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේදී පවත්වන ලදී.

	දිනය	සහභාගිත්වය
1.	2023.01.17	06
2.	2023.02.10	08
3.	2023.03.09	06
4.	2023.05.15	08
5.	2023.05.30	07
6.	2023.06.28	06
7.	2023.08.28	06
8.	2023.09.08	07
9.	2023.09.22	08
10.	2023.10.20	07
11.	2023.12.07	05



SDFL
Creating Career Confidence ...

විගණන හා කළමනාකරණ කමිටුව - 2023

නිපුණතා සංවර්ධන අරමුදලේ විගණන හා කළමනාකරණ කමිටුව සඳහා මහා භාණ්ඩාගාර නියෝජිත ඇතුළුව සාමාජිකයින් පස් දෙනෙකු වන අතර, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නාරාහේන්පිට නිපුණතා සංවර්ධන අරමුදලේදී පහත සඳහන් පරිදි පවත්වන ලදී.

01. කමිටු සභාපති - ඩී.පී.ජී. ප්‍රදීප් මහතා (භාණ්ඩාගාර නියෝජිත)
02. කමිටු සාමාජික - ආර්.එම්.ඩී.එම්. කුමාරි මහත්මිය (අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිත)
03. කමිටු සාමාජික - චතුර ද සිල්වා මහතා
04. කමිටු සාමාජික - නීතා ප්‍රියංගනී මහත්මිය (විගණන අධිකාරී)
05. කමිටු සාමාජික - එච්.ඩී. අනුරුද්ධිකා මහත්මිය (ප්‍රධාන අභ්‍යන්තර විගණක)

2023 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලද ආකාරය පහතින් දැක්වේ.

දිනය	සහභාගී වූ සංඛ්‍යාව
2023.10.04	05



SDFL
Creating Career Confidence ...

අවදානම් කළමනාකරණ උපායමාර්ග.....



අවදානම් කළමනාකරණය යනු අවදානම හඳුනාගැනීමඇගයීම සහ ප්‍රමුඛස්ථානය , අනුව සැකසීම තුලින් අනවශ්‍ය සිදුවීමක් ඇතිවීමේ සම්භාවිතාවය අවම .කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමයි අප වෙත අවදානම් පැමිණීමේ මුහුණුවරයන් ලෙස මූල්‍ය වෙළඳපොල ,නෛතික වගකීම් ,අවිනිශ්චිතතාවයන් ව්‍යාපෘති ,ණය අවදානම් ,හදිසි අනතුරු අසමත්වීම් හා ස්වභාවික ව්‍යවසනයන් වැනි අනපේක්ෂිත තත්ත්වයන් හඳුනාගත හැකියඒවා කල්තියා හඳුනාගෙන එම . .අවදානම් කළමනාකරණය කිරීමට අප ආයතනය අපේක්ෂා කරයි

වර්ෂයේදී නිපුණතා සංවර්ධන අරමුදලේ අවදානම් කළමනාකරණය කිරීම සඳහා ආයතනයක් ලෙස 2023 කළමනාකාරීත්වය විසින් පහත ප්‍රධාන ක්‍රියාමාර්ග ගන්නා ලදී .

1. අවදානම හඳුනාගැනීම.විස්තර කිරීම සහ තර්ජනයන් තක්සේරු කිරීම ,
2. ඉතා වැදගත් වත්කම් වලට විශිෂ්ඨ තර්ජනයන්ට මුහුණදීමේ හැකියාව තක්සේරු කිරීම.
3. අවදානම තීරණය කර ගැනීම.
4. අවදානම අඩු කිරීමේ ක්‍රම හඳුනාගැනීම .
5. උපායමාර්ගයකට අනුව අවදානම අඩුකිරීමේ මිනුම් ප්‍රමුඛස්ථානයට අනුව සැකසීම.

අභ්‍යන්තරව මෙන්ම බාහිරවද ආයතනයකට අවදානම් ඇතිවිය හැකියඅභ්‍යන්තරව ඇතිවන අවදානම් . කළමනාකරණය කර ගැනීමට ආයතනයක් වශයෙන් හැකියාව තිබුණද බාහිරව ඇති වන අවදානම් අවම .කර ගැනීමට ඒවාට සාර්ථකව මුහුණදිය යුතුමය

ව 2023ර්ෂය වන විට රටතුල ඇතිව ඇති ආර්ථික අර්බුදයත් සමඟ විශාල දුෂ්කරතා රැසකට මුහුණදීමට සිදුවියබඳවාගැනීම් නතර කොට සීමිත ,වියදම් පාලනයටත් ,ඒ අනුව අමතර වියදම් කපාහැරීමටත් . කාර්යමණ්ඩලයකින් සියලු කාර්යයන් ඉටුකර ගනිමින් ආයතනික කටයුතු සාමාන්‍යාකාරයෙන් .පවත්වාගෙන යන ලදීඅප වෙත පැමිණෙන්නා වූ අවදානම් නිසියාකාරව කළමනාකරණය කර ගනිමින් .වර්ෂයේදී යම්තාක් දුරකට පැවති අවදානම් අවම කර ගන්නා ලදී 2023

SDFL
Creating Career Confidence ...

සමාජ වගකීම් (CSR) පිළිබඳ ආයතනයේ වගකීම



ආයතනික සමාජ වගකීම යනු ව්‍යාපාරයක් සමාජය, පරිසරය සහ ආර්ථිකය සඳහා වගකීමක් දරන ආකාරයයි .ලාභය පමණක් නොව, සමාජ සුභසාධනය, පාරිසරික තිරසාරභාවය සහ සේවක සුභතා වැනි අංගයන් සලකා බලයි. නිපුණතා සංවර්ධන අරමුදල සිය ආයතනික සමාජ වගකීම් සමුදාය ඉටු කිරීමෙහිලා වැදගත් කාර්ය භාරයක් සිදු කරන අතර අනාගත පරපුර උදෙසා උරුම කළ යුතු සම්පත් ආරක්ෂාකර ගනිමින් අප අපගේ සියලු ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු නිරන්තරයෙන් ඒ හරහා ඒකාබද්ධ කර ගනිමින් පවත්වා ගෙන යන්නෙමු.

සමාජ වගකීම් ඉටු කරමින් ආයතනයේ සාර්ථකත්වය කරා ගමන් කිරීමට නිබඳව අප සියලු දෙනා කැපවීමෙන් කටයුතු කරනු ඇත උදාහරණ වශයෙන් .අධ්‍යාපනය සඳහා සහාය වීමපරිසර ආරක්ෂණ , පුහුණු වැඩසටහන් ආදිය පැව ,ජල සුරක්ෂණය ,ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමැත්වීමෙන් ප්‍රජා සවිබල ගැන්වීම් හා සේවක සුබසාධන වැඩසටහන් පැවැත්වීම ආදිය ක්‍රියාවට නංවමින් සමාජ වගකීම යන කාර්යභාරයද ඉටු කරලමින් ආයතනික කටයුතු සාර්ථකව පවත්වාගෙන යනු ලබයි .

ඉදිරියේදී සමාජ වගකීම් ඉටු කිරීම උදෙසා වාර්ෂිකව මුදලක් වෙන් කරමින් ඒ සඳහාද අවධානය යොමු කිරීමට අපේක්ෂා කරනු ඇත. ඉදිරි වසරේදී වෙළඳපල සීමා ඉක්මවා යාම සඳහා නව පාඨමාලා හඳුන්වාදීමටත්, Digital Transformation වැඩසටහන් මගින් වාණිජ ක්‍රියාවලීන් සක්‍රීය කිරීමටත්, සේවක කැපවීම හා තිරසාර සංවර්ධනය සඳහා නවතම KPI පද්ධතියක් පිහිටුවාලීමටත් අපේක්ෂා කරනු ඇත.

SDFL
Creating Career Confidence ...

වැඩසටහන්

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ සේවායෝජකයන්ගේ මානව සම්පත පුහුණු කිරීම සහ සංවර්ධන අවශ්‍යතාවයන් සපුරාලීමට උපකාර කිරීම ය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල විසින් පසුගිය කාලවකවානුව තුළ පෞද්ගලික අංශයේ කාර්මික සහ වෙළඳ ආයතන සඳහා පුහුණු වැඩසටහන් විශාල සංඛ්‍යාවක් පවත්වනු ලැබීය. ඊට සමගාමීව රාජ්‍ය ආයතන වශයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ ආරක්ෂක අංශයන් ද තම කාර්ය මණ්ඩල පුහුණු කර ගැනීම සඳහා සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදලේ සහාය ලබාගෙන තිබේ. එසේම රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම ආයතන සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල සංවිධානය කරන වැඩසටහන්වල පාඨමාලා වෙනුවෙන් සම්බන්ධ වීමට මහත් උනන්දුවක් දක්වන බව සැලකිය යුතුය.

සමාලෝචිත වර්ෂය (2023) තුළ සී/ස නිපුණතා සංවර්ධන අරමුදල විසින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව මෙම වසර තුළ විවෘත වැඩසටහන් සඳහා සහභාගිකයින් 1,620 ද, සේවාදායකස්ථ වැඩමුළු සඳහා සහභාගිකයින් 2,139 ද, වෙනත් වැඩසටහන් වෙනුවෙන් සහභාගිකයින් 475 ද, සහභාගි වී තිබෙන අතර රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතිය යටතේ පෞද්ගලික ආයතන 05 ක්ද සම්බන්ධ කර ගෙන තිබේ.

විවිධ ආකාරයන් යටතේ 2023 වසරේ පවත්වන ලද වැඩසටහන් පහත පරිදි වේ.

01) විවෘත වැඩමුළු

	වැඩමුළුවේ මාතෘකාව	සහභාගී වූවන් සංඛ්‍යාව
1	"රියදුරු සහ කාර්යාල කාර්ය සහයකයින් සඳහා ආචාර ධර්ම සහ විනය" පිළිබඳ වැඩමුළුව	12
2	"ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි" පිළිබඳ වැඩමුළුව	16
3	"හඳුන්වා දීමේ පුහුණුව" පිළිබඳ වැඩමුළුව	14
4	"රියදුරු සහ කාර්යාල කාර්ය සහයකයින් සඳහා ආචාර ධර්ම සහ විනය" පිළිබඳ වැඩමුළුව	14
5	"අවසාන ගිණුම්" පිළිබඳ වැඩමුළුව	11
6	"මූලික විමර්ශන" පිළිබඳ වැඩමුළුව	28
7	"රාජ්‍ය ආයතනවල විගණන ගැටළු අවම කර ගන්නේ කෙසේද" පිළිබඳ වැඩමුළුව	18
8	"පුද්ගලික ගොනු නඩත්තු කිරීම" පිළිබඳ වැඩමුළුව	23
9	"ප්‍රවාහන කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව	12
10	"සිවිල් විශ්‍රාම වැටුප් ගණනය කිරීම" පිළිබඳ වැඩමුළුව	13
11	"කාර්යාල කළමනාකරණය සහ ආචාර ධර්ම" පිළිබඳ වැඩමුළුව	10
12	"අලාභ සහ පාඩු ප්‍රතිසාධනය සහ කපා හැරීම" පිළිබඳ වැඩමුළුව	10
13	"රජයේ වැටුප් ගෙවීම් පද්ධතිය" පිළිබඳ වැඩමුළුව	17
14	"අභ්‍යන්තර විගණනයේ මූලිකාංග" පිළිබඳ වැඩමුළුව	17

SDFL
Creating Career Confidence ...

15	"කාර්යාල කළමනාකරණය සහ මූල්‍ය නියාමනය" පිළිබඳ වැඩමුළුව	18
16	"විශ්‍රාම වැටුප් ගෙවීම" පිළිබඳ වැඩමුළුව	15
17	"රියදුරු සහ කාර්යාල කාර්ය සහයකයින් සඳහා ආචාර ධර්ම සහ විනය" පිළිබඳ වැඩමුළුව	32
18	"රජයේ වැටුප් ගෙවීම් පද්ධතිය" පිළිබඳ වැඩමුළුව	15
19	"පරිපාලන නිලධාරීන්ගේ රාජකාරි සහ වගකීම" පිළිබඳ වැඩමුළුව	8
20	"රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය" පිළිබඳ වැඩමුළුව	25
21	"ප්‍රවාහන කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව	65
22	"කාර්යාල උපකරණ පාලනය" පිළිබඳ වැඩමුළුව	28
23	"ලේකම් සහ පිළිගැනීමේ කාර්යමණ්ඩලය සඳහා දුරකථන කුසලතා සහ ආචාර විධි පුහුණුව" පිළිබඳ වැඩමුළුව	9
24	"විනය පටිපාටිය" පිළිබඳ වැඩමුළුව	31
25	"පුද්ගලික ගොනුව නඩත්තු කිරීම" පිළිබඳ වැඩමුළුව	32
26	"වඩා හොඳ වැඩ පරිසරයක් සඳහා වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව" පිළිබඳ වැඩමුළුව	20
27	"දත්ත විශ්ලේෂණය සඳහා Advanced Microsoft Excel පුහුණුව" පිළිබඳ වැඩමුළුව	11
28	"ධනාත්මක මනෝවිද්‍යාව සහ ආතති කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව	16
29	"ඩීසල් උත්පාදක" පිළිබඳ වැඩමුළුව	11
30	"අලාභ හානි අයකර ගැනීම සහ කපා හැරීම (104)" පිළිබඳ වැඩමුළුව	10
31	"කාර්යාල ක්‍රියා පටිපාටිය සහ සාමාන්‍ය ගොනු කිරීම" පිළිබඳ වැඩමුළුව	35
32	"නිවාඩු ලිපිකරුගේ කාර්යභාරය සහ වගකීම්" පිළිබඳ වැඩමුළුව	15
33	"ආරක්ෂක නිලධාරීන් සහ නිලධාරීන් සඳහා රාජකාරි වගකීම් සහ ආචාර ධර්ම" පිළිබඳ වැඩමුළුව	11
34	"ලංසු ඇගැයීමේ ප්‍රායෝගික අංශ" පිළිබඳ වැඩමුළුව	12
35	"කාර්ය සාධන ඇගයීම සහ KPI සැකසීම" පිළිබඳ වැඩමුළුව	21
36	"වැටුප් පරිවර්තනය" පිළිබඳ වැඩමුළුව	23
37	"බදු නීති සම්පාදනය" පිළිබඳ වැඩමුළුව	25
38	"ව්‍යාපෘති කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව	13
39	"DO සහ MA හි වෘත්තීය සංවර්ධනය වැඩි දියුණු කිරීම" පිළිබඳ වැඩමුළුව	41
40	"රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන ක්‍රියා පටිපාටියේ ප්‍රධානීන්" පිළිබඳ වැඩමුළුව	10
41	"ආයතනික සැලසුම් සංවර්ධනය" පිළිබඳ වැඩමුළුව	14
42	"කැබිනට් පත්‍රිකා සකස් කිරීම" පිළිබඳ වැඩමුළුව	32
43	"මූලික විමර්ශන" පිළිබඳ වැඩමුළුව	14
44	"රියදුරු සහ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම සහ විනය" පිළිබඳ වැඩමුළුව	14
45	"සිද්ධි කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව	21
46	"අත්තිකාරම් බී ගිණුම" පිළිබඳ වැඩමුළුව	15
47	"කොන්ත්‍රාත් පරිපාලනය, ගෙවීම් ක්‍රියාපටිපාටි සහ කොන්ත්‍රාත් ගොනු නඩත්තුව" පිළිබඳ වැඩමුළුව	23
48	"ලේකම් පරිවයන්" පිළිබඳ වැඩමුළුව	14
49	"බුද්ධිමත් කාර්යාල ශිල්පක්‍රම" පිළිබඳ වැඩමුළුව	17
50	"අලාභ හානි අයකර ගැනීම සහ කපා හැරීම (104)" පිළිබඳ වැඩමුළුව	12
51	"නව විගණන පනත" පිළිබඳ වැඩමුළුව	15
52	"ආයතන සංග්‍රහය සහ Psc රීති" පිළිබඳ වැඩමුළුව	12
53	"විනය පටිපාටි" පිළිබඳ වැඩමුළුව	14
54	"නිවාඩු ලිපිකරුගේ යුතුකම් සහ වගකීම්" පිළිබඳ වැඩමුළුව	31
55	තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදනය පිළිබඳ වැඩමුළුව	18
56	"වෙළඳසැල් කළමනාකරණය සහ මිලදී ගැනීමේ කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව	9

SDFL
Creating Career Confidence ...

57	"බදවා ගැනීමේ පටිපාටිය" පිළිබඳ වැඩමුළුව	11
58	"කාර්යාලීය ලිපි ලිවීම" පිළිබඳ වැඩමුළුව	19
59	"ෂොෆ්ට්ගේ කාර්යභාරය සහ වගකීම්" පිළිබඳ වැඩමුළුව	19
60	"ඩිජිටල් අලෙවිකරණය" පිළිබඳ වැඩමුළුව	18
61	"ප්‍රවාහන කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව	42
62	"කාර්යාල කළමනාකරණය සහ මූල්‍ය නියාමනය" පිළිබඳ වැඩමුළුව	21
63	"ව්‍යාපෘති කළමනාකරණය" පිළිබඳ වැඩමුළුව	13
64	"රජයේ වැටුප් ගෙවීම් පද්ධතිය" පිළිබඳ වැඩමුළුව	10
65	"රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය" පිළිබඳ වැඩමුළුව	32
66	"ධනාත්මක ආකල්ප,අභිප්‍රේරණය සහ නායකත්වය" පිළිබඳ වැඩමුළුව	16
67	"අභ්‍යන්තර විගණන සහ අභ්‍යන්තර පාලන පද්ධතිය" පිළිබඳ වැඩමුළුව	25
68	"විනය පටිපාටිය" පිළිබඳ වැඩමුළුව	21
69	"වැටුප් පරිවර්තනය" පිළිබඳ වැඩමුළුව	45
70	"ගිණුම් ලිපිකරුගේ කාර්යභාරය සහ වගකීම" පිළිබඳ වැඩමුළුව	18
71	"ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීමේ ක්‍රියා පටිපාටිය" පිළිබඳ වැඩමුළුව	14
72	"පුද්ගලික ගොනුව නඩත්තු කිරීම" පිළිබඳ වැඩමුළුව	22
73	"ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන්නේ කෙසේද" පිළිබඳ වැඩමුළුව	19
74	"ඩීසල් ජෙනරේටරය ක්‍රියාත්මක කිරීම සහ වැළැක්වීමේ නඩත්තුව" පිළිබඳ වැඩමුළුව	16
75	"කැබිනට් පත්‍රිකා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම" පිළිබඳ වැඩමුළුව	74
76	"වාර්ෂික තොග සත්‍යාපනය සහ බැහැර කිරීමේ ක්‍රියා පටිපාටිය" පිළිබඳ වැඩමුළුව	19
77	"මූලික විමර්ශන" පිළිබඳ වැඩමුළුව	20
78	"දත්ත විශ්ලේෂණය සඳහා Advanced Microsoft Excel පුහුණුව" පිළිබඳ වැඩමුළුව	16
79	"ආයතන සංග්‍රහය සහ Psc රීති" පිළිබඳ වැඩමුළුව	26
80	"ඉහළ ඵලදායිතාව සඳහා ආචාර ධර්ම සහ විනය" පිළිබඳ වැඩමුළුව	42

SDFL
Creating Career Confidence ...

02) සේවාදායකස්ථ වැඩමුළු

	වැඩමුළුවේ මාතෘකාව	සහභාගී වූවන් සංඛ්‍යාව
1	කාර්යක්ෂමතා කඩඉම් විභාග කාර්යාල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	53
2	NMRA සඳහා ආයතන සංග්‍රහය සහ මූල්‍ය නියාමනය	35
3	කාර්යක්ෂමතා කඩඉම් විභාග මූල්‍ය නියාමනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	53
4	කාර්ය සාධන ඇගයීම සහ KPI සැකසීම	17
5	කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන MM&JM කාණ්ඩය - මන්තායි ලුණු සමාගම	6
6	Mantai Salt Ltd ආයතනයේ MA කාණ්ඩය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග දැනුවත් කිරීමේ වැඩසටහන	11
7	කාර්යක්ෂමතා කඩඉම් විභාග PL ශ්‍රේණි සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන - මන්තායි ලුණු සමාගම	6
8	සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	32
9	මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ සඳහා රියදුරන් සඳහා ආචාර ධර්ම සහ විනය	6
10	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය - Lanka Prospate	15
11	DLB සඳහා අලාභ අයකර ගැනීම සහ කපා හැරීම (104)	32
12	මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික කවුන්සිලය සඳහා නිවැරදි ආකල්ප තුළින් අභිප්‍රේරණය	20
13	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා ගබඩා කළමනාකරණය	40
14	දැව සංස්ථාව සඳහා පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම	50
15	සංවර්ධන ලොතරැයි මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන	42
16	ලංවිම සඳහා ලේකම් පරිවයන්	50
17	DLB සඳහා සිදු කරන ලද අලාභ අයකර ගැනීම සහ කපා හැරීම (104)	26
18	සංවර්ධන ලොතරැයි මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන	12
19	DLB අභ්‍යන්තර පාලන පද්ධතිය	25
20	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ගබඩා කළමනාකරණය	50
21	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සඳහා කාර්ය සාධන ඇගයීම සහ KPI සැකසීම	50
22	නාවික හමුදාව සඳහා ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීමේ ක්‍රියා පටිපාටිය	20
23	නාවික හමුදාව සඳහා ලංසු ඇගයීම	10
24	සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	5
25	නාවික හමුදාව සඳහා ස්මාර්ට් කාර්යාල ශිල්පීය ක්‍රම	15

SDFL
Creating Career Confidence ...

26	ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය සඳහා ආයතන සංග්‍රහය, මූල්‍ය නියාමනය සහ විගණන පනත	36
27	සුරාබදු දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරීන්ගේ රාජකාරි සහ වගකීම්	40
28	සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා අවසාන ගිණුම් සකස් කිරීම	40
29	ජාතික යොවුන් සේනාංකය සඳහා ධනාත්මක ආකල්ප සහ සේවා ස්ථාන ආචාර විධි	18
30	මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය සඳහා අලෙවිකරණ උපාය මාර්ග සංවර්ධනය කිරීම	20
31	ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	16
32	LECO සඳහා කාර්යාල ආධාරක පිළිබඳ වෘත්තීය දැනුම සහ ආකල්ප වැඩි දියුණු කිරීම	30
33	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රියදුරු සහ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම සහ විනය	56
34	මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ කුසලතා සංවර්ධනය	5
35	ඩොක්යාර්ඩ් සඳහා ෆෝමන්/අධීක්ෂක සංවර්ධනය	43
36	ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා උත්සව කළමනාකරණය	31
37	ජාතික යොවුන් සේනාංකය සඳහා ධනාත්මක ආකල්ප සහ සේවා ස්ථාන ආචාර විධි	77
38	ආයතන සංග්‍රහය සහ PSC නීති පිළිබඳ වැඩමුළුව	48
39	අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ රියදුරු සහ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම සහ විනය	18
40	කාර්යක්ෂමතා කඩඉම් විභාගය - දැනුවත් කිරීමේ වැඩසටහන SLAERC	4
41	අභ්‍යාස දෙපාර්තමේන්තුව සඳහා රාජ්‍ය අංශයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම	35
42	ගල්කිරියාගම පුහුණු මධ්‍යස්ථානය සඳහා ආයතන සංග්‍රහය සහ සාමාන්‍ය බඳවා ගැනීම්	149
43	අම්පාර පුහුණු මධ්‍යස්ථානය සඳහා ආයතන සංග්‍රහය සහ සාමාන්‍ය බඳවා ගැනීම්	70
44	ඩොක්යාර්ඩ් සඳහා ෆෝමන්/අධීක්ෂක සංවර්ධන වැඩසටහන	44
45	ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සඳහා පාඩු, පාඩු අයකර ගැනීම් සහ කපා හැරීම්	50
46	ශ්‍රේෂ්ඨාධිකරණය සඳහා මහජන ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය	10
47	මැණික් හා ස්වර්ණාභරණ පුහුණු ආයතනයේ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම සහ විනය	8
48	ජාතික යොවුන් සේනාංකය සඳහා ධනාත්මක ආකල්ප සහ සේවා ස්ථාන ආචාර විධි	69
49	බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා DO & MA හි වෘත්තීය සංවර්ධනය වැඩි දියුණු කිරීම	31
50	සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සඳහා KPI සහ කාර්ය සාධන ඇගයීම් ආකෘති සංවර්ධනය කිරීම	1
51	ජාතික පොලිස් කොමිසමේ සුළු කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම සහ විනය	12
52	ජාතික පොලිස් කොමිසම සඳහා රියදුරන් සඳහා ආචාර ධර්ම සහ විනය	5
53	මැණික් හා ස්වර්ණාභරණ පුහුණු ආයතනය සඳහා Avanced Excel	21
54	ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව සඳහා මූල්‍ය නියාමනය	120
55	රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව සඳහා කාර්යාල සහාය පිළිබඳ ආකල්ප සහ වෘත්තීය දැනුම	36
56	මැතිවරණ කොමිසම සඳහා පරිගණක දෘඩාංග	19
57	දැව සංස්ථාව සඳහා වාර්ෂික තොග සත්‍යාපනය	50
58	ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා මහජන ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය	16
59	ධීවර අමාත්‍යාංශයේ කාර්යයන් සහ ශාස්ත්‍රපති උපාධි සඳහා කාර්යාල කළමනාකරණය සහ ආචාර ධර්ම	44
60	ඔම්බුඩ්ස්මන් කාර්යාලය සඳහා නිලධාරීන්ගේ ආකල්ප සහ වෘත්තීය දැනුම වැඩි දියුණු කිරීම	16
61	පරිසර අමාත්‍යාංශය සඳහා කාර්යාල කළමනාකරණය සහ වෘත්තීය සංවර්ධනය	120
62	රජයේ නිලධාරීන් දැනුවත් විය යුතු නීති CIDA	20
63	අමාත්‍ය මණ්ඩල කාර්යාලය සඳහා ධාරිතා වර්ධන පුහුණුව	30

SDFL
Creating Career Confidence ...

03) විභාග

	වැඩමුළුවේ මාතෘකාව	සහභාගී වූවන් සංඛ්‍යාව
1	TRCSL සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	10
2	කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	64
3	ජාතික ලුණු සමාගම සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	23
4	ජාතික ලුණු සමාගම සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පරිවර්තන (දෙමළ සහ ඉංග්‍රීසි) ගාස්තුව	23
5	සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	26
6	නාරා සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	26
7	සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	45
8	TRCSL බඳවා ගැනීමේ විභාගය	84
9	NMRA සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	58
10	සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	12
11	NMRA පරිවර්තනය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය	58
12	ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග	16
13	ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග	1
14	කාර්යක්ෂමතා කඩඉම් විභාග	9

04) අධ්‍යයන පුහුණු පාඨමාලා

	වැඩමුළුවේ මාතෘකාව	සහභාගී වූවන් සංඛ්‍යාව
01	රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	9
02	රාජ්‍ය නීති ක්‍රියා පටිපාටිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	11


SDFL
Creating Career Confidence ...

වැඩසටහන්වල ආදායම, වියදම සහ ලාභය

සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රයන් වන බැංකු පොළිය / භාණ්ඩාගාර තැන්පතු හැරුණුවිට වැඩසටහන් සහ උපදේශන සේවාවන් මඟින් සැලකිය යුතු ආදායමක් අරමුදල විසින් උපයනු ලබයි. 2022 සහ 2023 වසරවල විවිධ ආකාරයේ වැඩසටහන් මඟින් උපයන ලද ආදායම්, වියදම් සහ ලාභයන් පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

2022 (රු. මිලියන)			2023 (රු. මිලියන)		
ආදායම	**වියදම**	**ලාභය**	**ආදායම**	**වියදම**	**ලාභය**
33.5	7.9	25.6	66.06	6.37	59.69

2023 වසර සලකා බලන කල සියළුම වැඩසටහන් රු. මිලියන 59.69 ක ලාභාංශ මත පවත්වන ලදී. එය සැබවින්ම සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ වැඩසටහන් කාර්යමණ්ඩලයේ සහ අනෙකුත් සහයෝගී කාර්යමණ්ඩලයේ කැපවීම මත ඉපැයීමකි.



SDFL
Creating Career Confidence ...

මූල්‍ය විග්‍රහය **2012/2013 - 2022/2023**

	2012/2013	2013/2014	2014/2015	2015/2016	2016/2017	2017/2018	2018/2019	2019/2020	2020/2021	2021/2022	2022/2023
මුළු ආදායම	32,526,480.00	46,946,179.50	56,310,690.00	51,624,800.00	52,963,915.00	93,588,360.00	89,465,586.00	69,605,960.00	16,833,187.50	23,779,300.00	40,178,720.00
ඍජු පිරිවැය	(17,262,506.95)	(23,083,957.66)	(28,442,936.49)	(29,223,183.64)	(34,268,023.37)	(54,854,980.74)	(46,655,701.07)	(32,994,642.56)	(6,232,043.38)	(4,683,247.76)	(6,686,429.47)
දළ ලාභය	15,263,973.05	23,862,221.84	27,867,753.51	22,401,616.36	18,695,891.63	38,733,379.26	42,809,884.93	36,611,317.44	10,601,144.12	19,096,052.24	33,492,290.53
අනෙකුත් ආදායම්	398,690.21	1,743.23	(127,930.33)	-	1,728,000.00	8,500.00	17,000.00	2,500.00	-	41,180.00	14,352.00
පරිපාලන වියදම්	(21,076,761.78)	(23,920,888.68)	(28,202,051.31)	(33,505,138.16)	(42,883,007.72)	(49,053,955.27)	(44,094,008.22)	(45,026,558.85)	(38,013,344.78)	(33,768,024.61)	(33,501,323.60)
පොලී හා බදු පෙර ලාභය	(5,414,098.52)	(56,923.61)	(462,228.13)	(11,103,521.80)	(22,459,116.09)	(10,312,076.01)	(1,267,123.29)	(8,412,741.41)	(27,412,200.66)	(14,630,792.37)	5,318.93
මුළු පොලී ආදායම	21,407,416.22	17,515,822.70	10,063,964.33	7,823,666.31	15,399,647.97	16,856,304.04	16,017,845.25	14,275,435.34	9,380,267.70	7,467,942.41	31,694,289.49
ආදායම් බද්ද	(4,287,651.00)	(3,564,122.00)	(2,297,893.03)	58,997.00	-	(1,548,530.85)	(4,356,349.37)	-	2,546,391.55	1,133,137.01	(3,108,286.74)
බදු පසු ලාභය	11,705,666.70	13,894,777.09	7,303,843.17	(3,220,858.49)	(7,059,468.12)	4,995,697.18	10,394,372.59	5,862,693.93	(15,485,541.41)	(6,029,712.95)	28,591,321.68
අනෙකුත් විස්තීරණ ආදායම්	(3,506.49)	(95,914.47)	(197,882.33)	-	-	-	(197,771.00)	498,179.00	(216,580.74)	(990,986.00)	629,880.00
වර්ෂයට අදාල මුළු විස්තීරණ ආදායම	11,702,160.21	13,798,862.62	7,306,843.17	(3,220,858.49)	(7,059,468.12)	4,995,697.18	10,196,601.59	6,360,872.93	(15,702,122.15)	(7,020,698.95)	29,221,201.68
කොටසක ඉපැයුම්	1.15	1.36	0.72	(0.32)	(0.69)	0.49	1.00	0.62	(1.54)	(0.69)	2.86
ජංගම නොවන වත්කම්	8,504,145.04	8,434,351.03	17,950,808.14	14,916,346.27	16,484,522.36	14,415,684.33	12,548,983.62	11,726,851.23	9,381,193.39	7,715,071.08	7,949,143.37
ජංගම වත්කම්	160,591,145.69	172,859,201.77	171,182,211.37	171,449,286.65	169,243,050.14	179,251,297.71	199,140,572.08	199,864,801.98	187,917,476.11	184,526,040.06	214,060,682.92
ප්‍රාග්ධනය හා සංචිත	161,539,158.86	178,538,638.13	183,097,560.98	179,876,702.49	172,817,234.37	177,812,931.55	199,460,102.79	200,056,223.65	185,609,890.16	178,589,191.21	209,212,887.15
ජංගම නොවන වගකීම්	1,389,718.81	1,681,155.71	5,175,207.44	5,092,082.68	5,879,886.67	6,849,094.45	7,303,741.99	7,800,408.99	8,531,848.57	10,219,125.47	10,940,127.86
ජංගම වගකීම්	6,166,413.06	1,073,758.96	860,251.09	1,396,847.75	7,030,451.46	9,004,956.04	4,925,710.92	3,735,020.57	3,156,930.77	3,432,794.46	1,856,811.28

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය

(2023/2024)

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

"නිපුණතා පියස", 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

"නිපුණතා පියස", 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

		2023/2024	2022/2023
	සටහන	**රු. ශත**	**රු. ශත**
ආදායම	03	86,874,195.92	40,178,720.00
සෘජු පිරිවැය	04	(10,609,726.25)	(6,686,429.47)
දළ ලාභය /(අලාභය)		**76,264,469.67**	**33,492,290.53**
ශුද්ධ වෙනත් ආදායම්	05	10,000.00	14,352.00
		76,274,469.67	**33,506,642.53**
පරිපාලන හා ආයතනික වියදම්	06	(43,866,193.49)	(33,501,323.60)
පොළී සහ බදුවලට පෙර ආදායම		**32,408,276.18**	**5,318.93**
ශුද්ධ මූල්‍ය ආදායම	07	30,705,156.88	31,694,289.49
බදු පෙර ලාභය		**63,113,433.06**	**31,699,608.42**
ආදායම් බදු	14	(18,774,502.47)	(3,108,286.74)
වර්ෂයේ ලාභය		**44,338,930.59**	**28,591,321.68**
වෙනත් විස්තීර්ණ ආදායම්			
නිශ්චිත ප්‍රතිලාභ සැලසුමේ ආයුසණක ලාභ/(අලාභ)		(591,757.89)	629,880.00
වර්ෂයේ සමස්ථ විස්තීර්ණ ආදායම		43,747,172.69	29,221,201.68
කොටසකින් ලද ඉපැයුම්	**18**	**4.29**	**2.86**

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයේ අත්‍යාවශ්‍ය හා වැදගත් අංග වේ. වරහන් යොදා පෙන්නුම් කර ඇත්තේ අඩු කළ අගයන් වේ.

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල
"නිපුණතා පියස", 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2023/2024 රු. ශත	2022/2023 රු. ශත
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	08	1,231,536.44	1,501,448.11
ස්ථාවර තැන්පතු ශිෂ්‍යත්ව අරමුදල		7,394,902.47	6,447,695.26
ජංගම වත්කම්			
තොග		898,600.50	501,292.75
ආයෝජන	09	245,625,189.41	173,543,218.38
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ	10	26,995,585.19	27,780,804.16
ලැබිය යුතු අදායම් බදු ආපසු ගෙවීම්		1,296,872.18	1,296,872.18
විලම්භිත බදු වත්කම්	15	1,428,376.90	2,669,730.69
මුදල් හා මුදල් සමාන දෑ	11	1,512,691.13	8,268,764.76
මුළු වත්කම්		**286,383,754.22**	**222,009,826.29**
හිමිකම් හා වගකීම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	12	102,001,520.00	102,001,520.00
ආදායම් සංචිත		479,890.00	479,890.00
රඳවාගත් ලාභ		150,500,949.84	106,731,477.15
මුළු හිමිකම		252,982,359.84	209,212,887.15
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම	13	5,662,437.17	4,775,946.82
නිපුණතා සංවර්ධන අර්ථසාධක අරමුදල	16	7,160,793.24	6,164,181.04
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	17	3,045,015.28	1,856,811.28
ගෙවිය යුතු ආදායම් බදු		17,533,148.69	
මුළු හිමිකම හා වගකීම්		**286,383,754.22**	**222,009,826.29**

2007 අංක 07 දරණ සමාගම් පනතින් නියම කර ඇති අවශ්‍යතාවන්ට අනුකූල වන අන්දමින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව සහතික කරනු ලැබේ.

....
ගණකාධිකාරී දිනය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම ගනු ලැබේ.
සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කර අනුමත කර ඇත.

....
සභාපති අධ්‍යක්ෂ

ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයේ අත්‍යාවශ්‍ය හා වැදගත් අංග වේ. වරහන් යොදා පෙන්නුම් කර ඇත්තේ අඩු කළ අගයන් වේ.

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල
"නිපුණතා පියස", 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ආදයම් සංචිත	රඳවාගත් ලාභ	එකතුව
	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත
2022 අප්‍රේල් 01 වන දිනට ශේෂය	102,001,520.00	479,890.00	76,107,781.21	178,589,191.21
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	28,591,321.68	28,591,321.68
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	629,880.00	629,880.00
පෙර වර්ෂ ගැලපීම්	-	-	1,402,494.26	1,402,494.26
2023 මාර්තු 31 වන දිනට ශේෂය	102,001,520.00	479,890.00	106,731,477.15	209,212,887.15
2023 අප්‍රේල් 01 වන දිනට ශේෂය	102,001,520.00	479,890.00	106,731,477.15	209,212,887.15
වර්ෂයේ ශුද්ධ ලාභය	-	-	44,338,930.59	44,338,930.59
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	(591,757.89)	(591,757.89)
පෙර වර්ෂ ගැලපීම්	-	-	22,300.00	22,300.00
2024 මාර්තු 31 වන දිනට ශේෂය	**102,001,520.00**	**479,890.00**	**150,500,949.84**	**252,982,359.84**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනිවාර්ය අංගයකි. වරහන් යොදා පෙන්නුම් කර ඇත්තේ අඩු කළ අගයන් වේ.

SDFL Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

"නිපුණතා පියස", 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2023/2024 රු. ශත	2022/2023 රු. ශත
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත/ (භාවිත) මුදල් ප්‍රවාහය		
බදු පෙර ශුද්ධ ලාභය/ අලාභය	63,113,433.06	31,699,608.42
ගැලපීම්		
ක්ෂය	587,611.67	818,877.72
පොළී ආදායම	(30,705,156.88)	(31,694,289.49)
මූල්‍ය පිරිවැය	108,635.00	56,870.00
පාරිතෝෂික වෙන්කිරීම්	1,192,607.46	1,273,278.00
කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් ලාභය	**34,297,130.31**	**2,154,344.65**
තොග (වැඩි වීම)/ අඩු වීම	(397,307.75)	78,626.63
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩි වීම)/ අඩු වීම	785,218.97	(3,370,502.36)
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ (වැඩි වීම)/ අඩු වීම	1,210,504.00	(173,488.92)
තරුණ කටයුතු අමාත්‍යාංශයට ගෙවිය යුතු දෑ(වැඩි වීම)/අඩු වීම	996,612.20	1,044,624.39
මෙහෙයුම් කටයුතු මඟින් ජනිත ශුද්ධ මුදල්	**36,892,157.73**	**(266,395.61)**
පාරිතෝෂික ගෙවීම්	(897,875.00)	(967,020.00)
ගෙවන ලද මූල්‍ය පිරිවැය	(108,635.00)	(56,870.00)
මෙහෙයුම් කටයුතු මඟින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	35,885,647.73	(1,290,285.61)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත/ (භාවිත) මුදල් ප්‍රවාහය		
ස්ථාවර තැන්පතු වල ආයෝජනය	(72,081,971.03)	(22,605,348.08)
ලද පොළී ආදයම	30,705,156.88	
31,694,289.49		
දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම්	(317,700.00)	(33,000.00)
දේපළ, පිරියත හා උපකරණ විකුණුම්	-	-
ශිෂ්‍යත්ව අරමුදලේ ආයෝජන - ස්ථාවර	(947,207.21)	(1,019,950.01)
ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(42,641,721.36)**	**8,035,991.40**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත/(භාවිත) මුදල් ප්‍රවාහය		
ලාභාංශ ගෙවීම්	-	-
මූල්‍ය කටයුතු මඟින් ජනිත ශුද්ධ මුදල්	-	-
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම/ (අඩු වීම)	**(6,756,073.63)**	**6,745,705.79**
කාලපරිච්ඡේදය ආරම්භයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	8,268,764.76	1,523,058.97
කාලපරිච්ඡේදය අවසානයේ පැවති මුදල් හා මුදල් සමාන දෑ	1,512,691.13	8,268,764.76
මුදල් හා මුදල් සමාන දෑ		
බැංකුවේ මුදල් - ලංකා බැංකුව - 801	1,210,575.57	3,495,144.66
ලංකා බැංකුව - ගිණුම් අංක 764148708	161,076.00	161,076.00
ඉල්ලුම් තැන්පතු	50,302.56	4,540,487.10
අතැති මුදල්	90,737.00	72,057.00
	1,512,691.13	8,268,764.76

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
වරහන් තුළ ඇති අගයන් අඩු කිරීම් ලෙස පෙන්වයි.

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

"නිපුණතා පියස", 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2023/2024

01. පොදු කරුණු

1.1 නෛතික තත්ත්වය

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල ශ්‍රී ලංකාව තුල සංස්ථාපනය කර නිත්‍ය වශයෙන් පවත්වා ගෙන යන සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය "නිපුණතා පියස", 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05 හි පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික ස්වභාවය

- රැකියා සඳහා ඇතුළත් වීමට අවශ්‍ය පුහුණු වීමට සහාය වීම, නිපුණතාව වැඩි දියුණු කිරීම, සේවකයින් ප්‍රතිපුහුණු කිරීම.
- ඉහළ මට්ටමක පුහුණුවක් සහ නිපුණතා පූර්ණ ශ්‍රම බලකාය සංවර්ධනය සඳහා ව්‍යවසාය පදනම් කොට ගත් පුහුණුව පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමට පහසුකම් සැපයීම.
- පුහුණු කිරීමේ ආයතන සහ සේවායයන් අතර සම්බන්ධතාවයන් සැපයීම.

1.3 නිකුත් කිරීම සඳහා අධිකාරී බලය දීම

2024 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සී/ස නිපුණතා සංවර්ධන අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන 2024 මැයි 31 දින නිකුත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර ලබා දී ඇත.

1.4 පිළියෙල කිරීමේ පදනම

1.4.1 අනුකූලවීමේ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන වල අඩංගු වන විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමඟ ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වලට සටහන් ("මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/ LKAS) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

SDFL
Creating Career Confidence ...

1.4.2 අඛණ්ඩභාවය

අධ්‍යක්ෂවරුන් සමාගමට ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර ඔවුන් ඈවර කිරීමට හෝ ව්‍යාපාරය නැවැත්වීමට අදහස් නොකරයි.

1.4.3 ඉදිරිපත් කිරීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් ද්‍රව්‍ය අයිතම හැර මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත.

- විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ආයුගණක තක්සේරුව මත පදනම්ව හඳුනාගෙන ඇත. (LKAS-19) (සටහන-13)

මූල්‍ය ප්‍රකාශනවල උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදුකර නොමැත.

1.4.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින්ය. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරඇති සියලුම මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නොමැති නම්, ආසන්නතම රුපියලට වටයා ඉදිරිපත් කර ඇත.

1.4.5 ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම් සම්මතයන් (SLFRS/ LKAS), තීන්දු සැදීමට කළමනාකරණ නියමයන්, ගිණුම් ප්‍රතිපත්ති භාවිතයේ බලපෑම සහ වත්කම් වල ආදායම් හා වියදම්හි වගකීම වාර්තාගත ප්‍රමාණයන් සමග අනුකූලතාවය තුළ සකස් කරනු ඇත.

විනිශ්චයන් හා ඇස්තමේන්තු, පෙර පළපුරුද්ද, නැඹුරුතාවයන් හා වාතාවරණයන් යටතේ සාධාරණ වීමට විශ්වාස කරන ලද අපේක්ෂාවන් ඇතුළත් වෙනත් කරුණු පදනම් වී ඇත. එපරිදිම සැබෑ ප්‍රතිඵල මෙම තීන්දු සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පනයන් ඉදිරියට යන කලින් සඳහන් කළ දෑ හි පදනම මත සමාලෝචනය කර ඇත. ගිණුම් ඇස්තමේන්තු වල පුනරීක්ෂණයන්, ගිණුම් ඇස්තමේන්තු ඇතුළත් කාල පරිච්ඡේදයන් තුළ සංශෝධනය කරන ලද හා අනාගතයට බලපාන ඕනෑම අනාගත කාල පරිච්ඡේද තුළ හඳුනා ගෙන ඇත. මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගත් ප්‍රමාණයන් මත වඩා අර්ථාන්විත බලපෑම් තිබෙන ගිණුම් ප්‍රතිපත්ති පිළිපැදීම තුළ අවදානම් තීන්දු පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන් තුළ ඇතුළත් කර ඇත.

SDFL
Creating Career Confidence ...

සටහන් 13 - අර්ථ දැක්වූ ප්‍රතිලාභ හා බැඳී ඇති මිණුම්

1.4.6 සංසන්දනාත්මක තොරතුරු

පෙර වර්ෂ වල සංශෝධන කර තිබෙන අදාල අවස්ථාවේ දී වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සහ වත්මන් වර්ෂය සමඟ සංසන්දනාත්මක වීමට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම් හා පැහැදිළි කිරීම් කර ඇත.

02 ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී යොදා ගෙන ඇති ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත විදහා දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති නිත්‍ය වශයෙන්ම සෑම වර්ෂයකම භාවිතා කර ඉදිරිපත් කර ඇති අතර නැතහොත් වෙනත් ආකාරයකට ප්‍රකාශ කර ඇත.

02.1 වත්කම් හා ඒවායේ ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන තුළ වර්තමාන වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද වත්කම් ස්වරූපයන්, මුදල්, බැංකු ශේෂ සහ සමාගමේ සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කාල ක්‍රමය ඇතුළත ප්‍රත්‍යක්ෂ කර ගැනීමට අපේක්ෂිත මුදල් හෝ වාර්තාකරණ දිනයේ සිට එක වර්ෂයක් ඇතුළත ඒවායින් කෙටිම අවස්ථාව, වත්කම්, වර්තමාන වත්කම් වලට වඩා වැඩිපුර ඇති වත්කම්, ඒවා වාර්තා කරන දිනට පසු වර්ෂයක කාලයක් රඳවා තබා ගැනීමට සමාගම අදහස් කරයි.

2.1.1 දේපළ, පිරියත හා උපකරණ

2.1.1.1 හඳුනා ගැනීම හා මැනීම

දේපළ, පිරියත හා උපකරණ, වටිනාකම අඩු පිරිවැයක දී සහ අඩු වීම එකතු වූ අලාභයන්හිදී ප්‍රකාශ කර ඇත.

අත්කර ගැනීමට දරණ පිරිවැය හා ඒවායේ ක්‍රියාකාරී තත්ත්වයට හෝ භාවිතයට අදහස් කරන තත්ත්වයට වත්කම් ගෙන ඒමට දරන ලද ඕනෑම සෘජු ආරෝපණීය වියදම් පිරිවැයට මෙම කරුණ සඳහා වන පිරිවැය ඇතුළත් ය. එසේම, පවතින වත්කම් වල කොටස් ගලවන හා ඉවත් කරන පිරිවැය ද ඇතුළත් ය.

ප්‍රධාන නොනිමි වැඩ විෂය වූ වත්කම් ගිණුම් වලට, ප්‍රයෝජනයට යොදා ගත් පළමු වතාවේම හෝ බලයලත් වත්කම් ඇති අවස්ථාවන් වෙත මාරු කර ඇත. කෙසේ වුවද වාර්තා කරන දිනට ප්‍රධාන නොනිමි වැඩ නොපවතී.

SDFL
Creating Career Confidence ...

දේපළ, පිරියත සහ උපකරණ සඳහා වෙනස් ප්‍රයෝජනවත් ජීව කාලයන් ඇති විට, ඒවා දේපල, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ වල බැහැර කිරීම මත ලාභ හා අලාභ, ඉවත් කිරීම් වලින් ලබන මුදල් හා දේපළ, පිරියත හා උපකරණ වලින් ගෙන යන ලද ප්‍රමාණයන් හා විස්තීර්ණ ආදායම් වාර්තා තුළ වෙනත් ආදායම් යටතේ හඳුනා ගත් දෑ අතර වෙනස ලෙස තීරණය කරනු ලැබ ඇත.

2.1.1.2 ආසන්නතම වියදම්

දැනට පවතින දේපළ, පිරියත හා උපකරණ මත දරා තිබෙන වියදම්, නියමාකාර ලෙස තක්සේරු කිරීම් තුළ සහ විශ්වාසනීය ලෙස මැනිය හැකි පිරිවැය, එවැනි වියදම් ප්‍රතිඵල ලබා ගත හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කර ඇති අවස්ථාවේ දී ප්‍රාග්ධනය සපයා ඇත. හිලව් කරන ලද වත්කම්හි ගෙන යන ප්‍රමාණය හඳුනා ගෙන නොමැත.

දේපළ, පිරියත හා උපකරණ වල ඒදිනෙදා සේවාවන්/ නඩත්තු සඳහා වන පිරිවැය, දරා ඇති ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇත. වත්කම් නැවත අගයන විටදී ඉපයීම් රඳවා ගන්නට මාරු කර ඇති වෙන් කරන ලද අතිරික්ත පිළිඇගයීම තුළ ඇතුළත් කොට ඇති ප්‍රමාණයන් පිළියෙල කර ඇත.

2.1.1.3 නැවත හඳුනාගැනීම

දේපළ, පිරියත හා උපකරණයන්හි අයිතම වල ගෙන යන ප්‍රමාණයන්, බැහැර කිරීම හෝ හඳුනා නොගත් හෝ අනාගත ආර්ථික වාසියක් නොමැති විට එම භාවිතයන් හෝ ඉවත් කිරීම අපේක්ෂා කෙරේ. හඳුනා නොගැනීම මත වන ලාභ හෝ අලාභ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ හඳුන්වා ඇත.

2.1.1.4 ණය ලබා ගැනීමේ පිරිවැය

ණය ලබා ගැනීමේ පිරිවැය, ලබා ගැනීමට සෘජුව ආරෝපණය කළ හැකි යෝග්‍ය වත්කම් වල, ඉදිකිරීම් හෝ නිෂ්පාදන භාවිතයට බලාපොරොත්තු වන හෝ විකිණීම සඳහා සූදානම් කිරීමට ප්‍රමාණවත් කාල පරිච්ඡේදයක් ලබා ගැනීම යන දෑ වත්කම් හි කොටසක් ලෙස මුදල් බවට පත්කර ගෙන ඇත. ණය ලබා ගැනීමේ පිරිවැයෙහි ප්‍රමාණයන් ප්‍රාග්ධනය සම්පාදනයට යෝග්‍ය දෑ, ණය ලබා ගැනීමේ පිරිවැය (LKAS-23) තුළ සම්මුතීන් සමඟ තීරණය කරයි.

ණය ලබා ගැනීමේ පිරිවැය, එය දරන හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ආරෝපිත කාල පරිච්ඡේදයක් තුළ වියදම් ලෙස හඳුනා ගත් දෑ මුදල් බවට පත්කර නොමැත.

SDFL
Creating Career Confidence ...

2.1.1.5 ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය

ක්ෂය අගය ගණනය කරනු ලබන්නේ වත්කමක පිරිවැය වන ක්ෂය කළ හැකි අගයෙන් හෝ පිරිවැය වෙනුවට වෙනත් ආදේශ කළ හැකි අගයෙන් එහි සුන්බුන් අගය අඩුකළ අගයටය. ලාභය හෝ අලාභය සඳහා එක් එක් වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ක්ෂයවීම් හඳුනාගනු ලැබේ, මන්ද වත්කම් තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව මෙය වඩාත් සමීපව පිළිඹිබු කරන බැවිනි.

ප්‍රවර්තන සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ.

පරිගණක උපකරණ	වසර	04	ට	වැඩි
වෙනත් කාර්යාල උපකරණ	වසර	05	ට	වැඩි
මෝටර් රථ	වසර	04	ට	වැඩි
නව කාර්යාල පරිශ්‍රය	වසර	10	ට	වැඩි
ගෘහ උපකරණ හා සවි කිරීම්	වසර	10	ට	වැඩි

වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතයට තිබෙන විටදී වන අතර වත්කම් ක්ෂය වීම නතර වන්නේ එම වත්කම විකිණීමට තබා ඇති බවට වර්ගීකරණය කළ දින හෝ වත්කමක් ලෙස හඳුනා නොගන්නා දින යන දිනවලින් මුල්ම දිනයට වේ.

ක්ෂය කරන ක්‍රමය, ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ සුන්බුන් අගයන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කර අදාල නම් ගලපනු ලැබේ.

2.1.1.6 මූල්‍යමය නොවන වත්කම් අඩු කිරීම

වත්කමක් හානිකරණය විය හැකි බවට ඇඟවීමක් තිබේද යන්න සමාගම සෑම වාර්තා කරන දිනකම තක්සේරු කරයි. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම් හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණය පරීක්ෂණයක් අවශ්‍ය වූ විට, සමාගම වත්කම් නැවත අයකරගත හැකි අගය පිළිබඳව ඇස්තමේන්තුවක් කරයි.

වත්කමක අයකරගත හැකි මුදල යනු භාවිතයේ පවතින වත්කමක වටිනාකම හෝ එහි සාධාරණ වටිනාකම යන අගයෙන් විකුණුම් පිරිවැය අඩුකල පසු ලැබෙන අගයෙන් වඩා වැඩි අගය වන අතර වත්කම වෙනත් වත්කම්වලින් හෝ වත්කම් සමූහයකින් බොහෝ දුරට ස්වාධීනව මුදල් ගලා ඒම උත්පාදනය නොකරන්නේ නම්, තනි වත්කමක් ලෙස දැක්වේ. වත්කමක ධාරණ අගය එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන විට, වත්කම් හානි වූ ලෙස සලකනු ලබන අතර එවිට එහි අයකරගත හැකි මුදලට දක්වා ලියාහැර ඇත.

SDFL
Creating Career Confidence ...

භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ පෙර බදු වට්ටම් අනුපාත භාවිතා කරමින් වන අතර එය මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම පිළිබඳ වර්තමාන වෙළඳපොල තක්සේරු කිරීම් පිළිඹිබු කරයි. විකුණුම් පිරිවැය අඩුකරන ලද සාධාරණ වටිනාකම තීරණය කිරීමේදී, මෑත කාලීන වෙළඳපොල ගනුදෙනු ඇත්නම් ඒවාද සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනුවක් හඳුනාගත නොහැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලැබේ.

අඛණ්ඩ මෙහෙයුම් වල හානිකරණ අලාභය, හානි වූ වත්කම්වල ක්‍රියාකාරීත්වයට අනුරූප වන එම වියදම් කාණ්ඩ තුලින් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගෙන ඇත. කලින් හඳුනාගත් හානිකරණ අලාභයක් ආපසු හරවනු ලබන්නේ අවසන් හානිකරණ අලාභය හඳුනා ගැනීමෙන් පසුව වත්කම්වල අයකරගත හැකි මුදල තීරණය කිරීමට භාවිතා කරන ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇත්නම් පමණි. එය එසේ වූ විට, වත්කම් ධාරණ අගය එහි ආපසු ලබාගත හැකි අගය දක්වා වැඩි වේ. පෙර වසරවල වත්කම් සඳහා කිසිදු හානිකරණ අලාභයක් හඳුනාගෙන නොතිබුණේ නම් එම වැඩිකල මුදල ක්ෂයවීම් අඩුකල ධාරණ අගය ඉක්මවිය නොහැක. එවැනි ආපසු හැරීමක් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන තිබේ.

2.1.2 මූල්‍ය උපකරණ

2.1.2.1 මූල්‍ය අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවකු හෝ මූල්‍ය උපකරණයක් සඳහා වන පාර්ශවකරුවෙකු එහි ගිවිසුම් ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වුවහොත් සමාගමට මූල්‍යමය අලාභයක් වීමේ අවදානමයි.

වෙළඳාම සහ වෙනත් ලැබිය යුතු දේ සහ ආයෝජන සම්බන්ධයෙන් සිදු වූ පාඩු පිළිබඳ ඇස්තමේන්තුව නිරූපණය කරන හානිය සඳහා දීමනාවක් සමාගම විසින් ස්ථාපිත කරනු ලැබේ.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් පියවා ඇති මූල්‍ය වගකීම් හා බැඳී ඇති බැඳීම් ඉටු කිරීමේ දී සමාගමට දුෂ්කරතා ඇති වීමේ අවදානමයි. ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය නම්, පිළිගත නොහැකි අලාභ හා සමාගමේ කීර්ති නාමයට හානියක් නොවී, සාමාන්‍ය හා ආතති තත්ත්වයන් යටතේ නියමිත කාලයට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි.

SDFL
Creating Career Confidence ...

පොලී අනුපාත අවදානම

වෙළඳපොළ පොලී අනුපාත වල වෙනස් වීමේ අවදානමට සමාගම නිරාවරණය වීම මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමඟ සමාගමේ දිගුකාලීන ණය බැඳීම් හා සම්බන්ධ වේ. ස්ථාවර හා විචල්‍ය අනුපාත ණය සහ ණය ගැනීම් වල සමතුලිත කළඹක් තිබීමෙන් සමාගම සිය පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි.

2.1.3 වෙළඳ ලැබිය යුතු දෑ

සමාගමට මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබාගැනීමට ගිවිසුම්ගත අයිතියක් ඇති විට පමණක්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ ලැබිය යුතු දෑ මූල්‍ය වත්කම් ලෙස සැලකේ.

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී විකුණන ලද භාණ්ඩ හෝ සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල්ය. වසරක් හෝ ඊට අඩු කාලයකින් එකතු කිරීම අපේක්ෂා කරන්නේ නම් (හෝ දිගු නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී) ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කෙරේ. එසේ නොමැති නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කෙරේ.

වෙළඳ ලැබිය යුතු දේ මූලිකව සාධාරණ වටිනාකමට හඳුනා ගැනේ. ඉන් පසුව, සමාගම විසින් ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් හානිකරණ අලාභ අඩුකරන ලද ක්‍රමක්ෂය පිරිවැය යටතේ වෙළඳ ලැබිය යුතු දෑ මනිනු ලබයි.

ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් වන මූලික වගන්ති වලට අනුව සමාගමට ලැබිය යුතු සියලුම මුදල් එකතු කිරීමට නොහැකි වන බවට මූලික සාක්ෂි ඇති විට වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණ ප්‍රතිපාදන සලසා තිබේ.

2.1.4 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් ශේෂයන් ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන, වැඩි ද්‍රවශීලතාවන් ඇති ආයෝජන, පහසුවෙන් වෙනස් කළ හැකි, මුදල් හා මුදල් ප්‍රවාහයේ ප්‍රකාශයන්හි අභිමතාර්ථය සඳහා ඉල්ලීම මත නැවත ගෙවිය යුතු බැංකු අයිරා වල ශුද්ධ අගය තුළ වත්කම්හි අවැදගත් අවදානම් විෂයන්හි, ප්‍රමාණයන් දැන ගැනීම, මුදල් හා මුදල් සමාන දෑ වලට අයත් වේ.

2.1.5 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගම විසින් ලබා ගෙන තිබෙන හෝ ගෙවිය යුතු සහ බහුමානය තුළ කොටස් නිකුත් කිරීමෙන් හා බහුමානය තුළ කොටස් ලබා ගැනීමෙන් සමාගමට ගෙවීමට ඇති සියලුම ප්‍රමාණයන්හි එකතුව ප්‍රාග්ධනය සඳහන් කිරීමට ඇතුළත් ය.

SDFL
Creating Career Confidence ...

2.1.6 වෙළඳ ගෙවිය යුතු දෑ

මුදල් වෙනත් මූල්‍ය වත්කම් නිදහස් කිරීමට ගිවිසුම පිළිබඳ බැඳීමක් සමාගමට තිබෙන විට එපමණක් වූ විට ඒවායේ මූල්‍ය ප්‍රකාශනයේ මූල්‍ය ස්ථාන වල ඇති විට මූල්‍ය වගකීම් ලෙස ඇති වෙළඳ ගෙවීම් සමාගම හඳුනාගනී.

වෙළඳ ගෙවීම් යනු භාණ්ඩ සහ ව්‍යාපාරයේ සැපයුම්කරුවන් වෙතින් සාමාන්‍ය පරිපාටිය තුළ ලබා ගෙන තිබෙන සේවා, ගෙවීමට ඇති බැඳීම්ය. ගණනය කළ ගෙවීම් යනු වසරක් ඇතුළත හෝ ඊට අඩු කාලයක දී (හෝ දීර්ඝ වුවහොත් සාමාන්‍ය ක්‍රියාත්මක කාලයක් තුළ) ගෙවිය යුතු ගෙවීම් වුවහොත් වත්මන් වගකීම් ලෙස වර්ග කර ඇත. නොවුනහොත්, ඒවා වත්මන් නොවන වගකීම් ලෙස ඉදිරිපත් කර ඇත.

වෙළඳ ගෙවීම්, පැහැදිලි අගයන් හිදී සහ ඵලදායී පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කරන ලද පිරිවැයක දී මැනීමකින් පසුව මූලික වශයෙන් හඳුනා ගෙන ඇත.

2.2 වගකීම් සහ වෙන්කිරීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් යනු ඉල්ලුම මත හෝ වාර්තා කළ දින සිට වසරක් ඇතුළත ගෙවීමට නියමිත වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කළ දින සිට වසරකට පසු ගෙවීමට නියමිත ශේෂයන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළහැකි වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් තිබේ නම් සහ එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වේ නම් ඒ සඳහා වෙන්කිරීම් හඳුනාගනු ලැබේ.

2.2.1 සේවක ප්‍රතිලාභ

2.2.1.1 නිශ්චිත දායක සැලසුම් - සේ.අ.අ. (EPF) හා සේ.භා.අ (ETF)

නිශ්චිත දායක සැලැස්මක් යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර වැඩි මුදල් ප්‍රමාණයක් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත. නිශ්චිත දායක විශ්‍රාම වැටුප් සැලසුම් සඳහා වන දායකත්වයන් සඳහා වන බැඳීම්, සේවකයින් විසින් සේවා සපයනු ලබන කාල පරිච්ඡේදවල ලාභ හෝ අලාභ වශයෙන් සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස පිළිගනු ලැබේ.

සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සේවකයන්ගේ දළ වැටුපෙන් 12% ක් දායක කරයි.

SDFL
Creating Career Confidence ...

සියලුම සේවකයින් සේවක භාරකාර අරමුදල සඳහා සුදුසුකම් ලබා ඇති අතර, එම සේවකයින්ගේ දළ වැටුපෙන් 3% ක් සමාගම විසින් දායක වේ.

2.2.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතින, විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණයක් අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් ලෙස නිර්වචනය කරයි.

සුදුසුකම්ලත් සියලුම සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ අවශ්‍යතාව පරිදි සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් සම්මත කර ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම, හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සඳහා වන ගැලපීම් සමඟ වාර්තා කරන දිනයේදී අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමකට දක්වා ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ වල දක්වා ඇති ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නම් කෙරෙන සහ කල් පිරීමට නියමිත අදාළ විශ්‍රාම වැටුප් වගකීම් කොන්දේසි වලට ආසන්නව පවතින රජයේ බැඳුම්කර වල පොලී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි.

අත්දැකීම් ගැලපීම් සහ ක්‍රියාකාරී උපකල්පනවල වෙනස්වීම් හේතුවෙන් ඇතිවන ලාභ සහ අලාභ ඒවා පැන නගින කාල සීමාව තුල වෙනත් විස්තීර්ණ ආදායම් වලට හර හෝ බැර කෙරේ.

සැලසුමෙහි වෙනස්කම් නිශ්චිත කාලයක් සඳහා (The Vesting Period) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසි සහිත වෙනත් නම් හැර අතීත සේවා පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ක්ෂණිකව හඳුනා ගැනේ. මෙහිදී, පසුගිය සේවා පිරිවැය නිරාවරණ කාල සීමාව තුල සරල රේඛීය පදනමක් මත ක්ෂය කරනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයකුට වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නිර්ණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 13 හි දක්වා ඇත.

2.3 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භව්‍යයන්

SDFL
Creating Career Confidence ...

අසම්භව්‍යයන් යනු අතීත සිදුවීමකින් පැන නගින වත්කම් හෝ බැඳීම් වන අතර සමාගමේ පාලනයෙන් ඔබ්බට පවතින අවිනිශ්චිත අනාගත සිදුවීම් ඇතිවීම හෝ සිදු නොවීම මත පමණක් තහවුරු වේ.

සියලුම ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භව්‍යය වගකීම් සටහන් අංක 19 හි අනාවරණය කර ඇත.

2.4 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ව්‍යදම් ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සමාගමේ ක්‍රියාකාරිත්වයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව වන අතර එබැවින් LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ විධිවිධානවලට අනුකූලව එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කෙරේ.

2.4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම් යනු හඳුනා ගන්නා ලද ප්‍රමාණයන්ට, ඒවායේ ව්‍යහැකි ආර්ථික ප්‍රතිලාභ සමාගම තුළට ගලා ගෙන එතැයි සහ ආදායම් හා දරණ ලද හවුල් පිරිවැය හෝ දැරිය හැකියැයි විශ්වාස කළහැකි යැයි මනින ලද ඒවායි. ආදායම් යනු මනින ලද ලැබී ඇති සහ ලැබීමට ඇති සාධරණ අගයක දී, වෙළඳ වට්ටම් සහ වෙළඳ බදු සහ සමාගම ඇතුළත ඉවත් කිරීමේ වෙළඳාම් වලින් පසුව ශුද්ධ අගයයි. පහත සඳහන් විශේෂිත නිර්ණායක ආදායම්හි හඳුනා ගැනීමේ අභිප්‍රාය සඳහා භාවිතා කර ඇත.

2.4.1.1 සේවාවන් සැපයීම

සේවාවන් සැපයීම තුළින් ලැබෙන ආදායම යනු ගිණුම්කරණය කරන කාල පරිච්ඡේදයක් තුළ සපයන ලද සේවා හෝ ඉටු කිරීම යන කුමක් හෝ තුළ හඳුනා ගන්නා ලද ඒවා ය.

2.4.1.2 පොළී ආදායම

පොළී ආදායම් යනු එකතුවන ලද පොළී හැටියට (වත්කම් ඵලදායී උපයා දීමක් ගිණුම්තුළට ගනිමින්) නැතහොත් එකතු කිරීමට වටිනවා යයි සැක ඇති ඒවා හඳුනා ගෙන ඇත.)

2.4.1.3 අපහරණය මත ලාභ හෝ අලාභ

දේපළ, පරියත හා උපකරණ වල අයිතමයන් හි බැහැර කිරීම් මත ලාභ හෝ අලාභ යනු වෙළඳාමෙන් ලබන ශුද්ධ මුදල් සමඟ දේපළ, පිරියත හා උපකරණයන් වලින් ගෙනයන ප්‍රමාණයන් සමඟ සැසඳීම මඟින් සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ "වෙනත් ආදායම්" ඇතුළත හඳුනා ගන්නා ලද යන ඒවා ලෙස තීන්දු කර ඇත.

SDFL
Creating Career Confidence ...

2.4.2 වියදම් හඳුනා ගැනීම

2.4.2.1 මෙහෙයුම් වියදම්

ව්‍යාපාරයේ එදිනෙදා ක්‍රියාකාරකම් වලදී සහ දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරනු ලබන සියලුම වියදම් වර්ෂය සඳහා ලාභ/ (අලාභ) වෙත ගැලපීමේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අයකරනු ලැබේ. මූල්‍ය නොවන වත්කම් හානිකරණය, දන්නා සියලු වගකීම් සහ දේපල, පිරියත හා උපකරණවල ක්ෂයවීම් සඳහාද ප්‍රතිපාදන සලසා ඇත.

පරිපාලන පිරිවැයේ ප්‍රතිශතය වැඩසටහනට අදාල පිරිවැය ලෙස හඳුනාගෙන දළ ලාභය ලැබීමට සෘජු පිරිවැය ලෙස ගලපයි. පිරිවැය බෙදාහැරීමේ ප්‍රතිශත පහත පරිදි වේ.

ලිපි ද්‍රව්‍ය	75%
දුරකථන	90%
ඉන්ධන	60%
ප්‍රවාහන	60%
අතිකාල දීමනා	50%
මුද්දර බදු	100%

2.4.2.2 බදු වියදම්

ආදායම් බදු වියදම් වත්මන් හා විලම්භීත බදු වලට අඩංගු වේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ බැහැර කිරීම් ප්‍රමාණයට එය විස්තර කරන සාධාරණත්වය තුළ හඳුනාගෙන ඇති විට, සාධාරණත්වය තුළ සෘජුව හඳුනාගන්නා ලද අයිතම ආදායම් බදු වියදම් ලෙස හඳුනාගනු ලැබ තිබේ.

2.4.2.2.1 ජංගම බදු වියදම

වත්මන් සහ සංසන්දනාත්මක කාලසීමාවන් සඳහා වත්මන් බදු වියදම මනිනු ලබන්නේ පසුව පනවන ලද නීති සම්පාදනය මඟින් හෝ වාර්තා කිරීමේ දිනය සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අංක 02 හි විධිවිධාන අනුව ගණනය කරන ලද අදාල තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයාට බදු ගෙවිය හැකි ආදායම මත ගෙවනු ලබන හෝ ගෙවීමට අපේක්ෂිත මුදල අනුවය.

SDFL
Creating Career Confidence ...

2.4.2.2.2 විලම්භීත බදු

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම් ධාරණ අගය සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතයෙන් විලම්භීත බදුකරණය හඳුනා ගැනේ.

පහත සඳහන් තාවකාලික වෙනස්කම් සඳහා කල් දැමූ බද්ද හඳුනා නොගනී. ව්‍යාපාරික සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු ගෙවිය හැකි ලාභයක් හෝ අලාභයක් කෙරෙහි බලපාන්නේ නැති ගනුදෙනුවකදී හඳුනාගන්නා ලද වත්කම් හෝ වගකීම් සහ නුදුරු අනාගතයේදී ආපසු හැරවීමක් සිදු කිරීමට අපේක්ෂා නොකරන අනුබද්ධිත ආයතනවල සහ ඒකාබද්ධව පාලනය වන ආයතනවල ආයෝජන වේ. ඊට අමතරව, කීර්තිනාමය මූලිකව හඳුනාගැනීම මත පැන නගින බදු ගෙවිය හැකි තාවකාලික වෙනස්කම් සඳහාද විලම්භීත බදු හඳුනා නොගනී.

විලම්භීත බදු මනිනු ලබන්නේ, වාර්තා කරන දිනය වන විට පනවා ඇති හෝ පනවන ලද නීති මත පදනම්ව ඒවා ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් සඳහා යෙදිය යුතු යැයි අපේක්ෂා කරන බදු අනුපාත වලටය. භාවිතයට නොගත් බදු පාඩු, බදු බැර කිරීම් සහ අඩුකල හැකි තාවකාලික වෙනස්කම් සඳහා කල් දැමූ බදු වත්කමක් ලෙස පිළිගන්නා අතර අනාගතයේදී බදු ගෙවිය හැකි ලාභයක් ලබාගැනීමට හැකි වන තරමට ඒවා භාවිතා කලහැකි වනු ඇත. විලම්භීත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරනු ලබන අතර අදාල බදු ප්‍රතිලාභය සාක්ෂාත් කර ගැනීමට තවදුරටත් සම්භාවිතාවක් නොමැති වීම දක්වා අඩු කරනු ලැබේ.

ජංගම බදු වගකීම්වලට එරෙහිව ජංගම බදු වත්කම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කල හැකි අයිතියක් තිබේ නම් සහ විලම්භීත බදු එම බදු අය කලහැකි ආයතනයට සහ එකම බදු අධිකාරියට සම්බන්ධ වූ විට විලම්භීත බදු වත්කම් සහ විලම්භීත බදු වගකීම් හිලව් කරනු ලැබේ.

2.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර සකස් කර ඇත. කල්බදු කුලී ගෙවීම්, ගෙවන ලද ලාභාංශ සහ ලැබෙන ප්‍රදාන මූල්‍ය මුදල් ප්‍රවාහ ලෙස වර්ග කර ඇති අතර ලැබෙන පොලී සහ ලැබෙන ලාභාංශ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කෙරේ.

2.6 කොටසක් මත ඉපයීම

සමාගම මූලික කොටසක් මත ඉපයීමේ (EPS) ඒවායේ සාමාන්‍ය කොටස් සඳහා දත්ත ඉදිරිපත් කරයි. කාල පරිච්ඡේදයක් අතරතුර කැපී පෙනෙන සාමාන්‍ය කොටස් ගණනේ සාමාන්‍යයකට බර තැබූ

SDFL
Creating Career Confidence ...

සමාගමෙහි සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට ආරෝපණීය ලාභ හෝ අලාභ බෙදමින් මූලික කොටසක් මත ඉපයීමේ (EPS) ගණනය කරනු ලබයි.

2.7 වාර්තා කරන කාල පරිච්ඡේදයකට පසු සිදුවීම්

වාර්තා කරන කාල පරිච්ඡේදයකට පසු සිදුවීම් යනු එම සිදුවීම් උපකාරක හා උපකාරක නොවන සිද්ධවීම් අතර කාල පරිච්ඡේදය අවසානයේදී සහ මූල්‍ය ප්‍රකාශනයන් නිකුත් කිරීමට අවසර ලබන ලද විට දිනය අතර කාලයයි. වාර්තා කරන කාල පරිච්ඡේදයකට පසුව සිදුවන සිදුවීම් වල ද්‍රව්‍ය වශයෙන් පැවතීම සලකනු ලැබ ඇත සහ අනාවරණය කරන්නට කාලානුරූප ගැලපීම් අවශ්‍ය තැනකදී මූල්‍ය ප්‍රකාශන තුළ නිර්මාණය කර ඇත.

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල
"නිපුණතා පියස" 7 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.
2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන 03	**2023/2024**	**2022/2023**
ආදායම	**රු. ශත**	**රු. ශත**
විවෘත වැඩසටහන් ආදායම	18,215,220.92	10,970,500.00
සේවාදායකස්ථ වැඩසටහන් ආදායම	11,407,975.00	7,081,220.00
අධ්‍යයන පුහුණු පාඨමාලා	1,200,000.00	565,000.00
රාජ්‍ය, පෞද්ගලික හවුල් වැඩසටහන් ආදායම	56,051,000.00	21,562,000.00
	86,874,195.92	40,178,720.00
සටහන 04		
ඍජු පිරිවැය (විකුණුම් පිරිවැය)		
එ/ කළා ආරම්භක තොගය	501,292.75	579,919.38
සම්පත්දායක ගාස්තු - විවෘත වැඩසටහන්	2,503,900.00	2,805,553.00
සම්පත්දායක ගාස්තු - සේවාදායකස්ථ වැඩසටහන්	2,822,652.50	1,295,315.00
සම්පත්දායක ගාස්තු - අධ්‍යයන පුහුණු වැඩසටහන්	349,200.00	424,100.00
තැපැල් ගාස්තු - වැඩසටහන්	305,010.00	299,475.00
වැඩසටහන් වලට අදාල පිරිවැය	559,466.00	183,677.84
ප්‍රවාහන සහ දෛනික සංයුක්ත දීමනා - වැඩසටහන්	20,855.00	12,626.00
ශාලා ගාස්තු	35,000.00	33,300.00
සංග්‍රහ - විවෘත වැඩසටහන්	3,039,105.50	741,635.00
සංග්‍රහ - සේවාදායකස්ථ වැඩසටහන්	443,425.00	159,800.00
සංග්‍රහ - අධ්‍යයන පුහුණු වැඩසටහන්	17,170.00	81,235.00
ඉන්ධන - වැඩසටහන්	-	95,400.00
සංයුක්ත දීමනා	455,750.00	292,500.00
රාජ්‍ය, පෞද්ගලික හවුල් වැඩසටහන් වියදම්	455,500.00	70,540.00
ප්‍රචාරණ - වැඩසටහන්	-	103,896.00
මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය - සේවාදායකස්ථ වැඩසටහන්	-	8,750.00
අ/ කළා අවසන් තොගය	(898,600.50)	(501,292.75)
	10,609,726.25	6,686,429.47
සටහන 05		
ශුද්ධ අනෙකුත් ආදායම්		
SME ව්‍යාපෘති ආදායම්	-	-
අ/කළා SME ව්‍යාපෘති වියදම්	-	(13,948.00)
SME ව්‍යාපෘතියෙන් ලද ශුද්ධ ආදායම්	-	(13,948.00)
අනෙකුත් ආදායම්	10,000.00	28,300.00
	10,000.00	14,352.00
සටහන 06		
පරිපාලන සහ ආයතනික වියදම්		
වැටුප් සහ වේතන	14,654,958.90	16,441,122.48
සභාපතිගේ දීමනා	1,565,050.00	1,194,500.47
සභාපතිගේ වාහන දීමනා	600,000.00	411,290.32
සභාපතිගේ සංග්‍රහ වියදම් දීමනා	60,000.00	42,962.38
සේවක අර්ථසාධක අරමුදලට	1,534,747.66	1,708,611.80
සේවක භාරකාර අරමුදලට	383,686.91	427,152.94
අතිකාල දීමනා	2,734,059.00	215,766.00
සේවක සුබසාධනය	854,647.00	500,914.00
කාර්යමණ්ඩල වාහන සහ අනෙකුත් දීමනා	121,000.00	272,241.94
පාරිතෝෂික	1,192,607.46	1,273,278.00
කාර්යමණ්ඩල දිරි දීමනා	600,000.00	675,000.00

SDFL
Creating Career Confidence ...

සටහන 06

ක්ෂයවීම්

ලීබඩු සහ උපකරණ	122,338.63	211,752.50
කාර්යාල උපකරණ	158,107.50	164,780.13
පරිගණක උපකරණ	108,402.39	171,330.55
නව කාර්යාල පරිශ්‍රය	107,447.94	122,037.17
වෙබ් පිටු	91,315.21	148,977.37
ගිණුම්කරණ පැකේජය නඩත්තු කිරීම	131,220.06	324,711.00
විගණන ගාස්තු	227,700.00	255,300.00
නීති, ලේකම් සේවා	395,964.62	179,288.20
තැපැල්	82,420.00	88,910.00
ලිපිද්‍රව්‍ය	1,784,547.50	1,293,893.45
මුද්‍රණ	1,174,837.50	480,249.50
දුරකථන	1,034,861.57	953,153.24
ප්‍රවාහන	422,113.00	413,261.00
ගිණුම්කරණ හා වෘත්තීය ගාස්තු	62,500.00	82,500.00
විදුලිය	2,461,408.25	1,069,005.09
ජලය	90,951.57	30,883.95
සනීපාරක්ෂක සේවා	444,854.00	411,523.07
රක්ෂණ - වාහන	120,562.26	166,068.77
ආරක්ෂක සේවා ගාස්තු	1,390,378.32	1,547,166.24
කාර්යමණ්ඩල පුහුණු හා නඩත්තු	1,249,140.00	238,000.00
ඉන්ධන	424,178.00	359,874.00
වාහන අළුත්වැඩියා සහ නඩත්තු	1,620,389.17	239,833.18
නඩත්තු වියදම්	779,692.87	359,342.86
කාර්යාල උපකරණ නඩත්තු වියදම්	135,780.00	25,825.00
වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියාව සහ නඩත්තුව	36,500.00	229,992.00
අධ්‍යක්ෂ මණ්ඩල පැමිණීමේ දීමනා	442,500.00	195,000.00
අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රවාහන දීමනා	195,000.00	50,000.00
අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංග්‍රහ වියදම්	330,151.00	61,450.00
පරිගණක නඩත්තු වියදම්	37,150.00	36,130.00
පුවත්පත් සහ වාර සඟරා	35,530.00	99,830.00
උත්සව සහ අවස්ථා වියදම්	501,861.20	29,545.00
බැංකු ගාස්තු	108,635.00	56,870.00
වෙබ් පිටු නඩත්තු වියදම්	-	4,000.00
වරිපනම් බදු	-	75,600.00
රක්ෂණ	114,999.00	119,000.00
සේවක බඳවාගැනීම් වියදම්	-	43,400.00
විගණන හා කළමනාකරණ කමිටු දීමනා	100,000.00	-
කමිටු රැස්වීම් දීමනා	30,000.00	-
උපදේශන සේවා	73,000.00	-
ණයගැති	2,937,500.00	-
මුද්දර ගාස්තු	1,500.00	-
	43,866,193.49	33,501,323.60

සටහන 07

ශුද්ධ මූල්‍ය ආදායම්

පොලී ආදායම - සේවක ණය	97,125.00	72,450.00
පොලී ආදායම - ස්ථාවර තැන්පතු	30,215,408.00	31,237,951.27
පොලී ආදායම - ඉල්ලුම් තැන්පතු	392,623.88	383,888.22
	30,705,156.88	31,694,289.49

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල
"නිපුණතා පියස" 07 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

2024 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
සටහන 08
දේපළ, පිරියත හා උපකරණ

වත්කම	ප්‍රතිශතය	පිරිවැය					ක්ෂයවීම්			
		2023.04.01 දිනට ශේෂය	**එකතු කිරීම්**	**මාරු කිරීම්/ අපහරණය**	**2024.03.31 දිනට ශේෂය**	**2023.04.01 දිනට ශේෂය**	**වසර තුල භාරය**	**මාරු කිරීම්/ අපහරණය**	**2024.03.31 දිනට ශේෂය**	**WDV 2024.03.31**
		රු. ශත	රු. ශත		රු. ශත	රු. ශත	රු. ශත		රු. ශත	රු. ශත
ලී බඩු සහ උපකරණ	10%	3,144,337.56	-	-	3,144,337.56	2,728,915.14	122,338.63	-	2,851,253.77	293,083.79
අනෙකුත් කාර්යාල උපකරණ	20%	6,358,169.04	317,700.00	-	6,675,869.04	6,119,276.24	158,107.50	-	6,277,383.74	398,485.30
මෝටර් රථ	25%	10,100,000.00	-	-	10,100,000.00	10,100,000.00	-	-	10,100,000.00	-
පරිගණක උපකරණ	25%	5,985,726.33	-	-	5,985,726.33	5,857,569.16	108,402.39	-	5,965,971.55	19,754.78
නව කාර්යාල පරිශ්‍රය	10%	7,947,948.11	-	-	7,947,948.11	7,320,287.60	107,447.94	-	7,427,735.54	520,212.57
වෙබ් පිටු	25%	832,789.40	-	-	832,789.40	741,474.19	91,315.21	-	832,789.40	-
		34,368,970.44	**317,700.00**	**-**	**34,686,670.44**	**32,867,522.33**	**587,611.67**	**-**	**33,455,134.00**	**1,231,536.44**

SDFL Creating Career Confidence...

සටහන 09

ආයෝජන

ස්ථාවර තැන්පතු-ලංකා බැංකුව	105,625,189.41	33,543,218.38
ස්ථාවර තැන්පතු- මහජන බැංකුව	140,000,000.00	140,000,000.00
	245,625,189.41	173,543,218.38

සටහන 10

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

කලින් ගෙවූ රක්ෂණ	65,661.68	65,661.68
ලැබියයුතු පොලී	4,463,255.00	6,711,355.54
ලැබියයුතු රඳවාගැනීම් බදු (WHT)	3,877,743.60	2,297,937.03
සේවක ආපදා ණය	1,867,570.88	1,710,070.88
අත්තිකාරම්	435,640.23	556,440.23
වෙළඳ ණයගැතියෝ	16,057,428.80	16,383,978.80
කලින් ගෙවූ කුලී - කාර්යාල පරිශ්‍රය	45,360.00	45,360.00
වැටුප් අත්තිකාරම්	10,000.00	10,000.00
සේවක ණය	172,925.00	-
	26,995,585.19	27,780,804.16

සටහන 11

මුදල් සහ මුදල් හා සමාන දෑ

ලංකා බැංකුව - ගිණුම් අංක 801	1,210,575.57	3,495,144.66
ඉල්ලුම් තැන්පතු	50,302.56	4,540,487.10
ලංකා බැංකුව - ගිණුම් අංක 76148708	161,076.00	161,076.00
අතැති මුදල්	90,737.00	72,057.00
	1,512,691.13	8,268,764.76

සටහන 12

ප්‍රකාශිත ප්‍රාග්ධනය

පූර්ණ වශයෙන් ගෙවීම් කළ සාමාන්‍ය කොටස් හා එක් රන් කොටසක්	102,001,520.00	102,001,520.00
	102,001,520.00	102,001,520.00

සටහන 13

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් - පාරිතෝෂික

	2023/2024 **රු. ශත**	**2022/2023** **රු. ශත**
වර්ෂය ආරම්භයේ පැවති ශේෂය	4,775,946.82	5,099,568.82
වර්ෂය තුල අයකිරීම	1,192,607.46	1,273,278.00
වර්ෂය තුල ගෙවීම්	(897,875.00)	(967,020.00)
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයේ ආයුගණන ලාභය/ අලාභය	591,757.89	(629,880.00)
වර්ෂ අවසාන ශේෂය	5,662,437.17	4,775,946.82

2024.03.31 දිනට සමාගමේ සේවකයන්ගේ පාරිතෝෂික වගකීමේ සත්‍ය තක්සේරුව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට (LKAS 19) අනුව සිදු කර ඇත. වර්ෂය තුළ රු. 476,215.26 ක් වර්තමාන සේවා පිරිවැය ලෙසත් රු. 716,392.20 මුදලක් පොලී පිරිවැය ලෙසත් හඳුනාගෙන ඇත.

පාරිතෝෂික වගකීම බාහිරව අරමුදල් සපයන්නක් නොවේ.

SDFL
Creating Career Confidence ...

සටහන 14

ආදායම් බදු

14.1 ප්‍රවර්තන වර්ෂයේ බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව සමාගම ව්‍යවස්ථාපිත බද්දෙන් ලැබෙන ලාභය සහ ආදායම පහත පරිදි වේ.

	2023/2024 රු. ශත	2022/2023 රු. ශත
ව්‍යවස්ථාපිත බදු අනුපාතය	30%	30%
ප්‍රවර්තන වර්ෂයේ ලාභය මත ආදායම් බදු (14.2)	17,533,148.69	-
තාවකාලික වෙනස්කම් වල ආරම්භය සහ ආපසු හැරවීම (15 සටහන)	1,241,353.79	3,108,286.74
	18,774,502.47	3,108,286.74

14.2 ගිණුම්ගත ලාභය සහ ආදායම් බදු අතර සැසඳීම

	2023/2024 රු. ශත	2022/2023 රු. ශත
ගිණුම්කරණ ලාභය/ (අලාභය) පොළී සහ බදු වලට පෙර	32,408,276	5,319
අනුමත නොකළ අයිතම	1,840,219	2,135,118
අවසරලත් අයිතම	(1,378,517)	(1,675,407)
අතිරේක: තක්සේරු කළහැකි ගාස්තු ශේෂ දීමනා	-	-
ව්‍යාපාරයේ ගැලපුම් ලාභය/ (අලාභය)	32,869,978	465,030
වෙනත් මූලාශ්‍ර වලින් ලැබෙන ආදායම - (පොළී ආදායම)	30,705,157	31,694,289
සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම	63,575,135	32,159,319
ව්‍යාපාර අලාභ හිමිකම් ඉල්ලීම	(5,131,306)	(32,159,319)
බදු අයකල හැකි ආදායම	58,443,829	-
සාමාන්‍ය ව්‍යාපාර සඳහා බද්ද	8,321,602	-
පොළී ආදායම් මත බද්ද	9,211,547	-
වර්ෂය සඳහා ලාභය මත ආදායම් බදු	17,533,149	-

සටහන 15

විලම්භිත බදු වත්කම්

	2023/2024 රු. ශත	2022/2023 රු. ශත
වර්ෂ ආරම්භක ශේෂය	2,669,730.69	5,778,017.43
විලම්භිත බදු සඳහා පෙර වර්ෂ ගැලපීම්	-	-
	2,669,730.69	5,778,017.43
තාවකාලික වෙනස්කම්වල ආරම්භය සහ ආපසු හැරවීම	(1,241,353.79)	(3,108,286.74)
වර්ෂ අවසාන ශේෂය	1,428,376.90	2,669,730.69

බදු වගකීම්වලට එරෙහිව බදු වත්කම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක කල හැකි අයිතියක් ඇති විට සහ එම විලම්භිත ආදායම් බදු මූල්‍ය අධිකාරියට අදාල වන විට විලම්භිත ආදායම් බදු සහ වගකීම් හිලව් කරනු ලැබේ.

	2023/2024 රු. ශත	2022/2023 රු. ශත
විලම්භිත බදු වත්කම්	1,698,744.72	2,988,179.42
විලම්භිත බදු වගකීම්	(270,367.82)	(318,448.73)
	1,428,376.90	2,669,730.69

	2023/2024		2022/2023	
	වත්කම්	වගකීම්	වත්කම්	වගකීම්
හඳුනා ලද්දැමූ බදු වත්කම් සහ වගකීම්				
වගකී ා වෙන්කිරීම්	-	270,367.82	-	318,448.73
වත්ක ා වෙන්කිරීම්	13.57	-	16,003.64	-
නිශ්විෂ ාහ වගකීම	1,698,731.15	-	1,432,784.05	-
භාවිතා නොකල බදු බැර	-	-	1,539,391.73	-
ආදායම් බදු ආපසු ලැබීම්	-	-	-	-
	1,698,744.72	270,367.82	2,988,179.42	318,448.73
ශුද්ධ විලම්භිත බදු	1,428,376.90	-	2,669,730.69	-

SDFL
Creating Career Confidence ...

සටහන 16

නිපුණතා සංවර්ධන අර්ථසාධක අරමුදල	31.03.2024	31.03.2023
	රු. ශත	රු. ශත
ගෙවියයුතු ශිෂ්‍යත්ව අරමුදල	7,160,793.24	6,164,181.04
	7,160,793.24	6,164,181.04

සටහන 17

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු විගණන ගාස්තු	227,700.00	255,300.00
ගෙවිය යුතු - ආරක්ෂක	115,864.86	128,930.52
ගෙවිය යුතු - විදුලිය	656,587.24	181,233.85
ගෙවිය යුතු - ජලය	32,449.46	2,863.35
ගෙවිය යුතු - ලේකම්	382,434.82	156,980.20
ගෙවිය යුතු - සනීපාරක්ෂක	36,886.00	106,153.83
ගෙවිය යුතු - සම්පත්දායක ගාස්තු	106,565.00	-
ගෙවිය යුතු - දුරකථන	65,200.44	88,526.07
ගෙවිය යුතු - පුවත්පත්	-	14,360.00
උපචිත වියදම් - අතිකාල	457,364.00	-
මාස 06 කට වඩා නියෝජනය නොකළ චෙක්පත් (801)	587,978.82	587,978.82
හඳුනා නොගත් තැන්පතු	375,984.64	334,484.64
	3,045,015.28	1,856,811.28

සටහන 18

කොටසක ඉපයීම්

කොටසක ඉපැයීම් ගණනය කිරීම පදනම් වී ඇත්තේ වර්ෂය සඳහා සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළහැකි ලාභය මත පදනම්ව වසර තුළ ඉතිරිව ඇති සාමාන්‍ය කොටස් වල බර කල සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීමය.

18.01 කොටසක මූලික ඉපයීම්	2023/2024 රු. ශත	2022/2023 රු. ශත
සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළහැකි ලාභය	43,747,172.69	29,221,201.68
සාමාන්‍ය කොටස්වල බැර කල සාමාන්‍ය සංඛ්‍යාව	10,200,152.00	10,200,152.00
කොටස් සඳහා ඉපයීම/ අලාභය	4.29	2.86

සටහන 19

ප්‍රාග්ධන බැඳීම්

වාර්තා කරන දිනය වන විට සමාගමට කිසිදු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීමක් නොතිබුණි.

සටහන 20

වාර්තා කරන කාලපරිච්ඡේදයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීම් වාර්තා කල දිනට පසුව සිදු නොවීය.

SDFL
Creating Career Confidence ...

සටහන 21

මූල්‍ය අවදානම් කළමනාකරණය

දළ විශ්ලේෂණය

මූල්‍ය උපකරණ භාවිතය හේතුවෙන් සමාගම පහත අවදානම්වලට නිරාවරණය වී ඇත.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම

ඉහත සඳහන් කළ අවදානම් වලට සමාගම කෙතරම් නිරාවරණය වේද යන්න සහ එම අවදානම මැනීම සහ කළමනාකරණය කිරීම සඳහා සමාගමේ අභිමතාර්ථය, ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටි මෙම සටහන මඟින් ඉදිරිපත් කර තිබේ.

අවදානම් කළමනාකරණ රාමුව

සමාගමේ අවදානම් කළමනාකරණ රාමුව ඇති කර එය අධීක්ෂණය කිරීමේ සමස්ථ වගකීම පැවරී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයට වේ. සමාගම විසින් මුහුණ දී සිටින අවදානම හඳුනා ගැනීමට හා විශ්ලේෂණයට, සුදුසු අවදානම් සීමා සහ පාලන ඇති කිරීමට, සහ අවදානම හා පාලන සීමාවන්ට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කර තිබේ. වෙළඳපල තත්ත්වයන්හි සහ සමාගමේ ක්‍රියාකාරකම්වල සිදුවන වෙනස්කම් පිළිබිඹු කෙරෙන අන්දමින් මෙම අවදානම් ප්‍රතිපත්ති කලින් කලට සමාලෝචනය කරනු ලැබේ.

ණය අවදානම

ණය අවදානම යනු යම් සේවාදායකයකු හෝ යම් මූල්‍ය මෙවලමකට සම්බන්ධ අනෙක් පාර්ශවය තමන්ට අදළ ගිවිසුම් බැඳීම් නිසි අයුරින් ඉටු නොකළහොත් සිදුවීමට ඉඩ ඇති මූල්‍යමය අලාභය වන අතර, එවන් අවදානමක් මූලික වශයෙන්ම පැන නගින්නේ සේවාදායකයින්ගෙන් හා ආයෝජන සුරැකුම්පත් වලින් සමාගමට අයවිය යුතු මුදල් හරහා වේ. මූල්‍ය වත්කම් වල පොතේ අගය මඟින් ණය අවදානමට ඇති උපරිම නිරාවරණය නියෝජනය වේ.
වාර්තා කරන දිනය වන විට ණය අවදානමට ඇති උපරිම නිරාවරණය පහත පරිදි වේ:

	31.03.2024	31.03.2023
	රු. ශත	රු. ශත
ණය සහ අයවිය යුතු දෑ		
වෙළඳ සහ වෙනත් අයවිය යුතු දෑ	28,292,457.37	29,077,676.34
ආයෝජන	245,625,189.41	173,543,218.38
මුදල් හා මුදල් සමාන දෑ	1,512,691.13	8,268,764.76
	275,430,337.91	210,889,659.48

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් ගෙවීම හෝ වෙනත් මූල්‍ය වත්කමක් හරහා පියවිය යුතු මූල්‍ය වගකීම් හා සම්බන්ධයෙන් සමාගමට ඇති බැඳීම් නිසි පරිදි සපුරාලීමට යාමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නට සමාගමට සිදුවේද යනුවෙන් ඇති අවදානමයි. මෙම අවදානම කළමනාකරණය සඳහා සමාගමේ එළඹුම වී ඇත්තේ ගෙවීමට නියමිත වගකීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් වන ද්‍රවශීලතාවයක් සාමාන්‍ය මෙන්ම ආතතිකාරී තත්ත්ව යටතේ පවා හැකිතාක් දුරකට පවත්වා ගෙන යාම තුළින් පිළිගත නොහැකි මට්ටමේ අලාභ හෝ සමාගමේ කීර්ති නාමයට හානි සිදුවීම වැලැක්වීමට කටයුතු කිරීමයි. ද්‍රවශීලතා අවදානම මැනීමට හා ඉන් විය හැකි හානිය අවම කිරීමට සමාගම තම ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය මනාව අධීක්ෂණය කරන අතර, යම් මට්ටමක මුදල් හා මුදල් සමාන දෑ පවත්වාගෙන යාම සහ මූල්‍ය ආයතන වෙතින් කැපවූ අරමුදල් පහසුකම් සහතික කර ගැනීමටද කටයුතු කර තිබේ.

	31.03.2024	31.03.2023
ව්‍යුත්පන්න නොවන මූල්‍ය වගකීම්	රු. ශත	රු. ශත
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	3,045,015.28	1,856,811.28
	3,045,015.28	1,856,811.28

සටහන 22

සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශන ආවරණය වන කාල පරිච්ඡේදය තුළ සමාගම සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සිදු කර ඇත. ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ගේ දීමනා පහත පරිදි වේ.

	2023/2024
	රු. ශත
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීමේ දීමනාව	442,500.00
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ප්‍රවාහන දීමනාව	195,000.00
	637,500.00

SDFL
Creating Career Confidence ...

2024 මාර්තු 31න් අවසන් වූ වර්ෂයේ
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

12.1 රන් කොටස් හිමිකරු

රන් කොටස් හිමිකරු වශයෙන් රන් කොටසෙහි හිමිකම දරන්නේ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් වන අතර, රන් කොටසේ හිමිකාරත්වය දරනු ඇත්තේ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් 'පත් කරන ලද අධ්‍යක්ෂවරයකු' තමන්ගේ නමින් නොව තම නිල නාමයෙන් පමණක් වේ. සාමාන්‍ය කොටස් හිමිකරුවකු සතු අයිතිවාසිකම් වලට අමතරව රන් කොටස් හිමිකරුවා සතු වන විශේෂ අයිතිවාසිකම් පහත දැක්වේ:

12.1.1 මහා සභා රැස්වීමේදී හෝ වෙනත් අවස්ථාවක දී සම්මත කර ගනු ලබන ඕනෑම සාමාන්‍ය, විශේෂ හෝ අතිවිශේෂ යෝජනාවක් එම අවස්ථාව අනුව සලකා බලන කල සමාගමේ මෙහෙවර, ඉලක්ක සහ අභිමතාර්ථයන්ට පටහැනි බවක් හෝ රජයේ ප්‍රතිපත්ති වලට අනුකූල නොවන බවක් රන් කොටස් හිමිකරුවාගේ හැඟීම වනු නම්, එවන් යෝජනා සම්මත නිෂේධ කිරීමේ බලය 'රන් කොටස්'' හිමිකරු සතුවේ.

12.1.2 'රන් කොටස' හා 'රන් කොටස්කරු' යන වචන වල නිර්වචනය සංශෝධනය කිරීමට සහ රන් කොටසේ හිමිකාරිත්වය දරන්නාගේ අයිතිවාසිකම් හා සම්බන්ධ වන කවර හෝ වගන්තියක් සංශෝධනය කිරීමට රන් කොටස හිමිකරුවාගේ පූර්ව ලිඛිත අවසරය ලබා ගන්නේ නම් 'විශේෂ යෝජනා සම්මතයක්' හරහා සමාගමේ මුල් සාංගමික ව්‍යවස්ථාව කලින් කලට වෙනස් කිරීමේ හැකියාව පවතී.

12.1.3 රන් කොටස් හිමිකරුවා සහ/ හෝ ඔහු නම් කළ තැනැත්තන් හමුවීමට අපේක්ෂා කරන්නේ නම්, සෑම මාස තුනකට වරක්ම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවීමට රන් කොටස් හිමිකරුවාට හිමිකම ලැබෙන අතර එසේ කැඳවුම් කරන ලද්දේ නම් රන් කොටස් හිමිකරුවා සහ/ හෝ ඔහු විසින් නම් කළ තැනැත්තන් හමු වී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යහපත වෙනුවෙන් සමාගම සම්බන්ධයෙන් වන කරුණු සාකච්ඡා කිරීමටත් අධ්‍යක්ෂවරුන් විසින් කටයුතු කළයුතු වේ.

12.1.4 රන් කොටස් හිමිකරුවා විසින් ලබා දෙන ලිඛිත එකඟතාවය සහ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ගේ බහුතර එකඟතාවය මත රන් කොටස් හිමිකාරත්වය සාමාන්‍ය කොටස් හිමිකාරත්වයක් බවට පරිවර්තනය කළ හැකිය.

12.1.5 සති දෙකකට පෙරාතුව සමාගමට සිදුකරන ලිඛිත දැනුම් දීමකින් අනතුරුව සමාගමේ ගිණුම් පොත් පරීක්ෂා කර බැලීමට රන් කොටස් හිමිකරුවාට සහ/ හෝ ඔහු විසින් නම් කරන ලද තැනැත්තන්ට හැකිය.

12.1.6 සෑම කාර්තුවක්ම අවසන් වී දින 60ක් ඇතුළත, එකී කාර්තුව තුළ සමාගමේ කාර්යසාධනය සම්බන්ධයෙන් රන් කොටස් හිමිකරු සහ සමාගම විසින් කළින් එකඟ වූ ආකෘතියකට අනුව සකස් කරන ලද කාර්තුමය කාර්යසාධන වාර්තාවක් රන් කොටස් හිමිකරුට ඉදිරිපත් කිරීමට සමාගම විසින් කටයුතු කරනු ඇත.

12.1.7 එක් එක් මුදල් වර්ෂය අවසන් වී දින 90 ක් ඇතුළත, රන් කොටස් හිමිකරුවා සහ සමාගම විසින් කළින් එකඟ වූ ආකෘතියක් භාවිතා කරමින් සමාගම පිළිබඳව තොරතුරු රන් කොටස් හිමිකරුවාට ඉදිරිපත් කිරීමට සමාගම විසින් කටයුතු කරනු ඇත.

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල
"නිපුණතා පියස" 07 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.
තක්සේරු වර්ෂය 2023/2024
ආදායම් බදු පරිගණනය
TIN අංකය: 134008326 0000

	සටහන		2023/2024
		රු. ශත	රු. ශත
ගිණුම්වලට අනුව ලාභ/ (අලාභ)			63,113,433
අඩු කිරීම: වෙළඳ හෝ ව්‍යාපාරයන්හි කොටස් වලින් නොවන ආදායම්			
පොලී ආදායම්			(30,705,157)
			32,408,276
එකතු කිරීම: ප්‍රතික්ෂේප කරන ලද අයිතම			
ස්ථාවර වත්කම් ක්ෂය වීම්		587,612	
සභාපතිගේ සංග්‍රහ වියදම්		60,000	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		1,192,607	1,840,219
			34,248,495
අඩු කිරීම: අඩුකිරීම්			
පාරිතෝෂික ගෙවීම්		897,875	
ස්ථාවර වත්කම් මත ප්‍රාග්ධන දීමනා	A	480,642	(1,378,517)
එකතු කිරීම: තක්සේරු කලහැකි ගාස්තු/තුලන දීමනාව			-
ව්‍යාපාරයෙන් ගැලපූ බදු ලාභය			**32,869,978**
පොලී ආදායම			30,705,157
සම්පූර්ණ ව්‍යවස්ථාපිත ආදායම			**63,575,135**
අඩු කිරීම: 2021/2022 වලින් ඉදිරියට ගෙන එන ලද අලාභ		5,131,306	
හිමිකම් කිවහැකි අලාභ ව්‍යවස්ථාපිත ආදායම් වල එකතුවෙන් 100%		(5,131,306)	(5,131,306)
2022/2023 වසර වලින් ඉදිරියට ගෙන ගිය අලාභ		-	
තක්සේරු කලහැකි ආදායම්/ බදු අයකල හැකි ආදායම්			**58,443,829**
බදු ගෙවියයුතු ප්‍රමාණයෙන් 30%			17,533,149
අඩුකිරීම්: බදු ණය			
පොලී ආදායම් මත රැඳවුම් බදු 2023/2024		1,706,704	
පොලී ආදායම් මත රැඳවුම් බදු 2022/2023		632,850	
පොලී ආදායම් මත රැඳවුම් බදු 2019/2020		579,971	
පොලී ආදායම් මත රැඳවුම් බදු 2018/2019		637,661	
ස්වයං තක්සේරු ගෙවීම්		-	(3,557,186)
ගෙවීමට ඇති බදු ශේෂය/ (හිමිකම් ලබාගැනීම්)			**13,975,963**

SDFL
Creating Career Confidence ...

සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

නිපුණතා පියස ̃ 07 වන මහල" 354/2" ඇල්විටිගල මාවත" කොළඹ 05.

2024 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බදු පරිගණනය සඳහා සටහන්

සටහන - A

ප්‍රාග්ධන දීමනා

වත්කම්	මිලදී ගත් වර්ෂය	අනුපාත	අවුරුදු ගණන	පිරිවැය	පෙර අයකිරීම්	වර්ෂය සඳහා අයකිරීම්	දිනයට අයකිරීම්
පරිගණක උපකරණ (05 වන වසර)	2019/20		5	90,000.00	72,000	18,000	90,000.00
පරිගණක උපකරණ (05 වන වසර)	2019/20		5	83,000.00	66,400	16,600	83,000.00
පරිගණක උපකරණ (05 වන වසර)	2019/20		5	125,400.00	100,320	25,080	125,400.00
පරිගණක උපකරණ (05 වන වසර)	2019/20		5	28,000.00	22,400	5,600	28,000.00
පරිගණක උපකරණ (05 වන වසර)	2019/20		5	14,500.00	11,600	2,900	14,500.00
පරිගණක උපකරණ (05 වන වසර)	2019/20		5	78,000.00	62,400	15,600	78,000.00
පරිගණක උපකරණ (05 වන වසර)	2019/20		5	135,000.00	108,000	27,000	135,000.00
පරිගණක උපකරණ (05 වන වසර)	2019/20		5	106,000.00	84,800	21,200	106,000.00
පරිගණක උපකරණ (02 වන වසර)	2022/23		5	33,000.00	6,600	6,600	13,200.00
කාර්යාල උපකරණ (05 වන වසර)	2019/20		5	29,000.00	23,200	5,800	29,000.00
කාර්යාල උපකරණ (05 වන වසර)	2019/20		5	235,750.00	188,600	47,150	235,750.00
කාර්යාල උපකරණ (05 වන වසර)	2019/20		5	104,405.00	83,524	20,881	104,405.00
කාර්යාල උපකරණ (05 වන වසර)	2019/20		5	39,500.00	31,600	7,900	39,500
කාර්යාල උපකරණ (05 වන වසර)	2019/20		5	36,700.00	29,360	7,340	36,700
කාර්යාල උපකරණ (05 වන වසර)	2019/20		5	5,500.00	4,400	1,100	5,500.00
කාර්යාල උපකරණ (04 වන වසර)	2020/21		5	208,523.00	125,114	41,705	166,818.40
කාර්යාල උපකරණ (01 වන වසර)	2023/24		5	15,900.00	-	3,180	3,180.00
කාර්යාල උපකරණ (01 වන වසර)	2023/24		5	301,800.00	-	60,360	60,360.00
ලී බඩු සහ උපකරණ (05 වන වසර)	2019/20		5	20,068.75	16,055	4,014	20,068.75
ලී බඩු සහ උපකරණ (05 වන වසර)	2019/20		5	67,520.00	54,016	13,504	67,520.00
ලී බඩු සහ උපකරණ (04 වන වසර)	2020/21		5	4,875.00	2,925	975	3,900.00
ලී බඩු සහ උපකරණ (04 වන වසර)	2020/21		5	68,580.00	41,148	13,716	54,864.00
වෙබ් පිටු (05 වන වසර)	2019/20		5	572,189.40	457,752	114,438	572,189.40
				2,403,211.15	**1,592,213**	**480,642.23**	**2,072,855.55**

SDFL
Creating Career Confidence ...

සභාපති

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල් සමාගමේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල් සමාගමේ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

SDFL Creating Career Confidence ...

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

SDFL
Creating Career Confidence ...

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවවුද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

SDFL
Creating Career Confidence ...

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිය / මඟ පෙන්වීම සඳහා යොමුව	**විස්තරය**
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයෙහි ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා වන මාර්ගෝපදේශ/ මෙහෙයුම් අත්පොත	
(i)	4.2 (උ) මාර්ගෝපදේශය	යම් වර්ෂයක් තුළ අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් 04ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් පවත්වා ඇත්තේ එක් රැස්වීමක් පමණි.
(ii)	4.4 වගන්තිය	ආයතනය තුල අභ්‍යන්තර විගණනයක් නිසි පරිදි සිදුකර නොතිබුණි.
(iii)	5.3 වගන්තිය	2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ණය ගෙවීමට හැකි බවට පරීක්ෂණ සිදුකර (Solvency Test) එම පරීක්ෂණය තෘප්ත කරන්නේ නම් බදු පෙර ලාභයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට/ කොටස් හිමියන්ට ගෙවීමට කටයුතු කල යුතු වුවත් ඒ අනුව ක්‍රියාකර නොතිබුණි.
(ආ)	1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛය	රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ දිරි දීමනා වශයෙන් රු. 600,000 ක මුදලක් ගෙවා ඇත.

SDFL
Creating Career Confidence ...

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 14 (1) වගන්තිය	සමාගම විසින් එහි පවත්වනු ලබන පාඨමාලා සහ විභාග තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි කළ යුතු වුවත්, 2024 මාර්තු 31 වන දින දක්වා සිදු කර නැත. විභාග සහ පාඨමාලා පැවැත්වීම සඳහා සමාගම ගිවිසුම්ගත වීමට පෙර, එම පාර්ශවයන් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම අවශ්‍ය වුවත් එසේ ලියාපදිංචි නොවූ ආයතන 05 ක් සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

රු. 161,076 ක් ඵලදායී ලෙස ප්‍රයෝජනයට නොගෙන පසුගිය වසර කිහිපයක සිට අක්‍රිය ජංගම ගිණුමක රඳවා ගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

SDFL
Creating Career Confidence ...